
# ශක්තිය


ප්‍රගතියේ ජනහඬ කැටුව එන පුවත්පත

තැපැල් කර්යාලයේදී ලියාපදිංචි කරන ලදී. QD/79 නිවුස් 2016

වෙළුම 13 | කලාපය 10 | 2016 ජනවාරි | මිල රු. 20/-

දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමාගේ
**56 වෙනි සාංවත්සරික සැමරුම**
**පසුගිය දා ගාලු මුවදුර පිටියේදී,**
**එතුමාගේ පිළිරුව අභියසදී සිදුවිය..**

'ගලන ගංගාව
පෙරට මිස..
ආපසු නොහැරේ..

යන වදන වර්ථමාන පක්ෂ නායකයින්ටද
එතුමා විසින් දෙන ලද
මහඟු ආදාර්ශ පාඨයකි..

# ආණ්ඩු පාලනය අවුල්!

## අයවැය ජංජාලයක් ! බඩු මිල නගී !

## මිල පාලනය විකාරයක් !

## "වව්චර්" කප්පාදු උපක්‍රමයක් !

**නීතියේ ආධිපත්‍ය, යහපාලනය හා ශිෂ්ඨ සමාජයක් ගැන පාරම්බාමින් බලයට පැමිණි මෛත්‍රී, රනිල් ආණ්ඩු පාලනය වසරක් ගතවීමටත් පෙර අභ්‍යන්තරෙන් මෙන්ම බාහිරින්ද දෙදරුම්කමින් පවතින බවත්, ඒ නිසාම නොසිතූ ලෙස දේශපාලන තත්වයේ නව හැරවුමකට රට ගමන්කරමින් පවතින බවත් දේශපාලන විචාරකයින්ගේ මතය වී තිබේ.**

විශ්වාසභංගය මගහරිමින්, පාර්ලිමේන්තුව විසුරුවා හැර රනිල්ගේ භාරකාර රජයක් යටතේ මහ මැතිවරණය පවත්වා, මැයි 15 සිට පළාත් පාලන ආයතන වල පාලනය නිළධාරී තන්ත්‍රයට යටත් කරමින්, සර්වජන ඡන්දබලයට හා ජනතා පරමාධිපත්‍යයට පස්ස හරවමින්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉවත් කිරීමට පාර්ලිමේන්තුවට පමණක් තිබූ තනි බලය ජනාධිපතිගේ නීති විරෝධී අධිකාරියට යටත් කරමින්, අධිකරණයේ ස්වාධීනත්වය කෙලසමින්, කටයුතු කළ හයිබ්‍රිඩ් ආණ්ඩුව සිය ප්‍රථම අයවැය මගින් හා අගමැතිගේ දේශපාලන ආර්ථික ප්‍රකාශනය මඟින් ආර්ථික වශයෙන්ද, දේශපාලන වශයෙන්ද අපරට අධිරාජ්‍යවාදීන්ට පාවාදී ඇති බව විචාරකයින්ගේම මතයවේ.

අධිරාජ්‍යවාදයට වහල්වූ ආර්ථිකයෙන් මිදීමේ පියවර රැසක් ගනිමින් මහින්ද රජය 2005 සිට පවත්වාගෙන ආ සමාජයට අවශ්‍ය පරිදි වෙළෙඳ පොල හසුරුවන සමාජ සුභසාධන රාජ්‍ය රටාව රනිල්, මෛත්‍රී හා රවී හවුල් ආණ්ඩුවේ අධිරාජ්‍ය ගැති නීයෝ ලිබරල් ආර්ථික වැඩපිළිවෙල මත පදනම් වු අයවැය මගින් කුණු බක්කියට දමා ඇතැයි වෘත්තීය සමිති නායකයෝ ප්‍රකාශ කරති.

රවී කරුණානායක මුදල් ඇමතිගේ ප්‍රථම අයවැය විශ්මය දනවන්නක් ලෙස හුවා දක්වමින් මහත් උජාරුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලත් එහි තිබූ ජනතා විරෝධී යෝජනා වලට වැඩකරන ජනතාව ඇතුළු සමස්ථ ජන සමාජයෙන් එල්ල වු දැඩි විරෝධය හමුවේ අයවැය එක් අදහසක් තුල පිහිටුවා සම්මත කිරීමට නොහැකි වීම වෘත්තීය සමිති හා ජනතා බලවේග ලැබූ ජයග්‍රහණයක් බවද එම වෘත්තීය සමිති නායකයින්ගේ අදහසයි.

එසේම රජයේ සේවය කප්පාදු කිරීම සඳහා පළමු පියවර මෙම අයවැය මඟින් තබා 2 වන පිටුවට

## වෙළඳපොලවාදය

ලංකාවේ වී ගොවිතැනින් ජීවත්වන සහ පෝෂණය වන 30% ක පමණ වූ වැසියන්ද වැඩි ආදායමක් ලැබිය හැකි භෝග වැවීම සඳහා වී ගොවිතැන අත්හැර දැමිය යුතු බවට හෙමින් සීරුවේ යෝජනා ඉදිරිපත්වෙමින් ඇත. එමඟින් ගොවීන්ගේ ආදායම් වැඩි කල හැකි බවත්, ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ දැමිය හැකි බවත්, තවද ඔවුන්ට ලොක වෙළෙඳ පොලෙහි ඇතිවන වැඩි ඉල්ලූමට දායකවිය හැකි බවත් එමගින් පොදුවේ ගැමි ආර්ථිකයේ වර්ධනයක් ඇතිකල හැකි බවත් පැවසේ. එහෙත් මේ සඳහා පරම කොන්දේසියක් ඇත. එනම් එකී නව භෝග සඳහා සහතික මිලක් අවශ්‍යය. අද ලෝක වෙළෙඳ පොලට එවැන්නක් ලබාදිය නොහැක. මේවන විට සහල්, සීනි, පිටි, මාංශ, කිරි ආදී ආහාර වර්ග සහ බොහෝ ප්‍රාථමික වෙළඳ ද්‍රව්‍ය මිල ඉතා පහළ මට්ටමකට බැස ඇත. මෙය ලෝක නිෂ්පාදනයේ වැඩිවීමක් සහ ඊට සමාන පාරිභෝජනයක් නොවීම නිසා සිදුවුවකි. ලෝක නිෂ්පාදන වියදම අඩු කිරීම සඳහා මුලික ද්‍රව්‍ය මිල අඩුකිරීම ලෝක වෙළෙඳ පොල පාලනය කරන බලවතුන් විසින් තීරණය කල බවද, ජොර්ජ් සෝරෝස්ගේ ප්‍රකාශයෙන් පෙනේ. නමුත් මේ නිසා සිදුවී ඇත්තේ කාර්මික නිෂ්පාදනද පහළ වැටීමය. මේ නිසා ලෝක අවපාතය දිග්ගැසේ. ඉන්දීය මහ බැංකු අධිපති රඝුරාම් රාජන් කියන පරිදි පවුල් වශයෙන්ද රාජ්‍යයන්ද, සමාගම්ද එකවගේ විශාල ණය බරකට හසු වී සිටී. මේ ණය කපා හැරිය හොත් හැර ලෝකයේ නව ආර්ථික නැග්මක් ඇති වන්නේ නැත. එහෙත් ණය කරුවෝ ණය කපා හරින්නේද නැත.■

## කුඩා රබර් කට්ටිකරුවන්ගේ අලාභය ගැන රජයට ශාපයක්..


රබර් කිලෝවකට පසුගිය රජය යටතේ දෙන ලද රු. 300/- අලෙවි මිල අනුව දෛනිකව රු 1500/- ක ආදායමක් ලැබූ අක්කර භාගයකට කට අඩු කුඩා රබර් කට්ටිකරුවන් හට මේ වන විට ලැබෙන්නේ රු. 750/- ක් පමණි. කිලෝවකට රු. 350/- ක් දෙන බවට පොරොන්දු වී ඡන්දය ලබාගෙන පසුව රු. 300/- මිලත් අහිමි කල රජයට තමන් ශාපකරන බව, ඉංගිරිය ප්‍රදේශයේ තුරුලිය වැඩසටහනට අයත් කුඩා රබර් කට්ටිකරුවන් පිරිසක් ශක්තියට පැවසීය.

වර්ෂාව නිසාද, කොළ හැලෙන මාස අත්හල විටද රබර් කිරි ලබාගත හැක්කේ මසකට දින 20 ක් තුල පමණක් බවද ඔවුහු පැවසීය. ජීවන වියදම වැඩිවෙද්දී මෙසේ තම ආදායම් කප්පාදු කල තමන් රවටා ඡන්දය ලබාගත් මේ ජාතික ආණ්ඩුවට ශාප කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවද ඔවුහු කියා ඇත.■

## දෙකක් කඩතොලු හදාගත්තේ
## රවී කරුණා චාරියා


මාධ්‍යවේදී වෙලින්ටන් කහඳවලආරච්චි


**සු**පුරුදු පරිද්දෙන් 2016 වසරටත් අයවැයක් ඉදිරිපත් කෙරුණි. එහෙත් එයට හරයක් හෝ යථාර්තයක් නැත. තිත්ත වුනත් ඇත්ත කියමු. අයවැය ඇතැම් යෝජනා නිදි පැදුරේම හකුළා ගත්තේය. මෙතරම් සංශෝධනයට, හා පරිච්ඡින්න වීමට භාජනය වු අයවැයක් මින් පෙර නොතිබුනි.



රටේ සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම් සඳහා මඟ පෙන්වන්නේ අයවැයෙනි. ඒ හා සැසදෙද්දී ද මෙවර අයවැය බාල වර්ගයේ එකකි.

අයවැයෙන් ප්‍රකාශ වු පරිදි අත්‍යාවශ්‍ය 2 වන පිටුවට

## මහා කම්කරු සමුළුවකට සැරසේ

වැඩකරන ජනතාව මුහුණ දෙන තීරණාත්මක ප්‍රශ්න කිහිපයක් පෙරටු කරගෙන දේශපාලන පක්ෂ භේදයකින් තොරව රාජ්‍ය අංශයට, අර්ධ රාජ්‍ය අංශයට හා පුද්ගලික අංශයන්ට අයත් වෘත්තීය සමිති හා වෘත්තීය සංගම් ගණනාවක් එකතු කරගත් ජාතික මහා සමුළුවක් කැඳවීමට කටයුතු සුදානම් වෙමින් ඇති බව වාර්තා වේ.

මේ සඳහා පෙරමුණ ගනු ලබන්නේ දේශපාලන පක්ෂ වලට බැදීමක් නැති 2 වන පිටුවට

'නව ව්‍යවස්ථාවක් ඉක්මනින් සම්මත කරනවා..'
-රනිල්



ඒකත් අය වැය වගේ හබක් වෙයි....
- ලැන්ටි

ශක්තිය
49 1/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
දුරකථනය: 011 2684820 ෆැක්ස්: 011 2684820
විද්‍යුත් තැපෑල : Shakthiya85@gmail.com
වෙබ්: www.shakthiya.org

## රාජිත ඇමතිතුමාගේ තර්ජනයට එරෙහිව අරගලයක හඬ

රජවාසල අරක් ගෙන රාජ උෂ්ණෝෂ් විරාජමානව හිඳින රාජිත ඇමැතිතුමා පසුගිය දා මාධ්‍යයට දැවැන්ත මඩ ප්‍රහාරයක් එල්ල කළේය. ජනමාධ්‍යවේදීන් ඇවන්ගාඩ් දූෂණවලට සම්බන්ධ වී එම ආයතනයෙන් මුදල් ලබාගත් බවට චෝදනා කළ හෙතෙම ඔවුන්ගේ නම් ගම් හා විස්තර රටට හෙළිදරව් කරන්නටද පොරොන්දු විය.

මේ දක්වා කිසිවෙකුගේ නම් ගම් හෙළිදරව් කිරීමට හෝ නීතිය ක්‍රියාත්මක කරවීමට ඇමැතිතුමාට නොහැකි විය. මෙය ආණ්ඩුවට එරෙහිව නැගෙන මාධ්‍ය බලවේගය දඩයම් කිරීමට යෙදූ උපායකි. මේවා හරිහමං මිනිස්සු කියන කතා නොවෙයි. කිසිදු හිරිකිතයකින් තොරව රටම දෙවනත් කරමින් එතුමා කළ මෙවැනි කතා මීට පෙරද අසා ඇත්තෙමු.

රාජිත ඇමැතිතුමා කළ යුතුව තිබුනේ දූෂණ චෝදනා තිබෙන මාධ්‍යවේදීන් දූෂණ කොමිෂම ඉදිරියට ගෙන ඒමයි. අනතුරුව ඒ බව ප්‍රකාශ කිරීමයි. එසේ නොමැතිව පදනම් විරහිත චෝදනා නගා සමස්ථ මාධ්‍යයටම අවලාද නගමින් මඩ ගැහීම නොවෙයි. සාධාරණ හේතු කාරණා නොමැතිව හිස් වචන දොඩමින් අමාත්‍යවරයා මාධ්‍යයේ ගෞරවයට හා අභිමානයට කළ තර්ජනය හා සිදුකල අපකීර්තිය අපි තරයේ හෙළා දකිමු.

ඉබාගාතයේ දිවෙන දේශපාලන වටපිටාවක රටත්, ජනතාවත්, ප්‍රජාතන්ත්‍රවාදයත් උදෙසා නොබියව නැගී සිටින අභියෝගාත්මක බලවේගය ජනමාධ්‍යයයි. අද එය ආණ්ඩුවට හිසරදයකි. ආණ්ඩු පත්කිරීමට මෙන්ම පෙරළා දැමීමටත් හැකියාව හා ශක්තිය තිබෙන දැවැන්තම හස්තය මාධ්‍යයයි. ඒ බැව් ලෝක සංසිද්ධීන්ගෙන් සනාථ වෙයි.

ස්වකීය ලාභ ප්‍රයෝජන හා වරප්‍රසාද පසෙකලා ප්‍රතිගාමී පැලැන්තියේ අවහිර බාධක හා අඩන්තේට්ටම් වලට ලක්වෙමින් මෙරට මාධ්‍යවේදීහු සත්‍ය සාධාරණය හා ජනතාව වෙනුවෙන් දිවි හිමියෙන් සටන් වදිති. ආණ්ඩුවලට කඩේ නොයති. මෙවන් පිරිසකට ඇමැතිතුමා එල්ල කළ චෝදනාව පිළිකුල් සහගතය. කණගාටුදායකය. බල තන්හාවෙන් ඔද්දල් වී හිඳින දේශපාලනඥයන්ගේ ගණයට විද්වත් මාධ්‍යවේදීන් ඇදදැමීම නොකළ යුතුය. එසේම මැරකමට හා චන්ඩිකමට බයේ ජනමාධ්‍ය යටත් නොවන බව සිහිපත් කරමු.■

## කඳුකර නව ගම්මාන සඳහා රාජ්‍ය ඉඩම් පවරාදීම

කඳුකරයේ තේ වගාව නිසා දැනට පවුල් ලක්ෂ 04 ක් පමණ පදිංචිවීමට ඉඩම් නොමැති කම්න් පීඩාවට පත්ව සිටී. මොවුන්ට නව ගම්මාන සැලසුම අනුව රාජ්‍ය ඉඩම් ලබාදීම, පසුගිය මැතිවරණ පොරොන්දුවක් විය.

එක් පවුලකට පර්චස් 07 බැගින් විකිණිය නොහැකි හා පවුල් සාමාජිකයන්ට බුක්ති පැවරිය හැකි පදනමක් මත ඉඩම් ලබාදීම, පමාවීම පිළිබඳව ජනතාව තුල කලකිරීමක් පවතින බව පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා ගරු කථානායකතුමා වෙත ප්‍රශ්ණයක් ඉදිරිපත් කර තිබේ.■

1 වන පිටුවෙන් **දෙකක් කඩතොලු..**

භාණ්ඩ එකොළහක මිළ ගණන් අඩුවිය යුතුය. නමුත් මේ දක්වා සියළු භාණ්ඩ සඳහා එම සහනය පාරිභෝගික ජනයා වෙත ළඟාවී නොමැත. පාරිභෝගික අධිකාරිය පවසනුයේ මෙම භාණ්ඩ අත්‍යාවශ්‍ය භාණ්ඩ නොවන බවයි. සෑම අයවැයකින්ම නිෂ්පාදනය නංවාලීම සඳහා අවශ්‍ය ණය, පොහොර, අමුද්‍රව්‍ය හා යටිතල පහසුකම් සපයා දුන්නද, මෙවර අයවැයෙන් එවැන්නක් දක්නට නැත. මින් ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ලවී අනාගතයේදී අනපේක්ෂිත ප්‍රශ්ණ රැසකට දොරගුළු විවෘත වෙයි. අපනයන නිෂ්පාදන සඳහා අවශ්‍ය විදේශ වෙළඳ පොල පුළුල් කිරීමට හා නිෂ්පාදනය නංවමින් නිෂ්පාදකයා දිරිගැන්වීමට යෝජනා නැත. ලෝක වෙළඳ පොලේ තරඟය තියුණුව තිබෙන අවධියක නිෂ්පාදන අපනයනය සඳහා සැලසුම් ගත ක්‍රමවත් වැඩපිළිවෙලක් අවශ්‍යය. පොහොර සහනාධාරය වෙනුවට කොමිස් ගන්නා වවුචර් ඒජන්තවරු අවශ්‍ය නැත. ආණ්ඩුව කරනුයේ වෙස් මුහුණු බැඳ නැටීමකි. ඔවුන්ගේ අවශ්‍යතාවය තේ, රබර් හා වී නිෂ්පාදකයා නිෂ්පාදනයෙන් බැහැර කර එම ඉඩම් විදේශිකයනට මංකොල්ල කා ගැනීමට ඉඩ හැරීමයි.

ආනයනික නිමි ඇඳුම් සඳහා වන 'සෙස්' බද්ද නිසා නිමි ඇඳුම් මිළ ඉහල යනු ඇත. ඊට සමගාමීව දේශීය රෙදිපිළි මිළද ඉහල නැංවෙයි. මෙය වෙළඳ හැරවුමයි. 'සෙස්' බද්ද හේතු කාරකව නිමි ඇඳුම් ආනයනය නතරවීම හෝ සීමාවීම මත ඉන් බඩ වියත රැකගත් දහස් ගණනක් දෙනා අසරණ තත්ත්වයට පාත්‍ර වෙති. පාසල් ළමුන්ගේ නිළ ඇඳුම් වවුචර් ක්‍රමයට බෙදාහැරීම නිසා එය අවුල් ජාලයක් වී ඇත. වවුචර් ක්‍රමය නිසා තවත් අතරමැදියෙක් බිහිවෙයි. එය අමතර වියදමකි. එම වියදම දෙමව්පියන් මත පැටවෙනු ඇත. අමාත්‍යවරයා පවසනුයේ මෙය මිලියන දෙකක ඉතිරියක් බවයි. එම මිලියන දෙකක බර ජනතාව මත හෙලා ඇත. වෙළඳ ප්‍රජාව ගැන අවබෝධය තිබිය යුතුය. යහපාලනය වවුචර් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වනුයේ තම ගජමිතුරන්ට කීයක් හෝ හරිහම්බ කර ගැනීමට ඉඩහැරීම විනා වෙන දෙයක් නොවේ. මෙය කූට උපායකි. අපි එය ගජමිතුරු සමාදානය ලෙස සලකමු.

මෙවර අයවැය හිඟය බිලියන (ප්‍රකෝටි) හත්දහස් හතලිහකි. සංශෝධන නිසා විඳින පාඩුව කෝටි එක්දහස් පන්සීයකි. මෙවැනි මූල්‍ය පදනමක ඉදිරිපත් වන අයවැයෙන් ඇතිවන ආර්ථිකයේ දැවැන්ත අවුල නිසා ජනතාව දුෂ්කරතාවයන් රැසකට මුහුණදෙනු ඇත. සැබෑ අය වැය හිඟය 7.1 % යයි සැලය.■

1 වන පිටුවෙන් **ආණ්ඩු පාලනය..**

ඇති අතර, රාජ්‍ය විශ්‍රාම වැටුප අහෝසි කිරීම, පොහොර සහනාධාර හා පාසල් නිළ ඇඳුම් කප්පාදු කිරීම, රජයේ සේවක දීමනා මූලික වැටුප තුල අඩු කිරීම, පුද්ගලික අංශයේ වැටුප රු. 2500/- කින් වැඩි නොකිරීම, ජාත්‍යන්තර තෙල් මිලේ විශාල වාසිය මෙම අයවැයෙන් පොකට් ගැසීම, ප්‍රකාශ කල අත්‍යවශ්‍ය භාණ්ඩ ගණනාවක මිල අඩුවීම වෙනුවට වෙළෙඳ පොලේ භාණ්ඩ මිල සීඝ්‍ර ලෙස ඉහළ යාම, තේ, රබර් වලට ලබාදුන් සහතික මිල අහෝසි කිරීම සහ වී වලට ලබාදුන් සහතික මිල අඩුකිරීම, ජාතික සම්පත් විදේශීය හා දේශීය සමාගම් වලට පාවාදීමට යෝජනා ඉදිරිපත් කිරීම ආදිය පිළිබඳව ආණ්ඩුවට සම්බන්ධ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ පවා දැඩි විරෝධය මෛත්‍රීපාල ජනාධිපති හරහා රනිල්ට හා ආණ්ඩුවට එල්ලවී ඇති අතර, ඒ අනුව ආණ්ඩුව තුල ප්‍රති විරෝධය තවදුරටත් තියුණුවී අයවැය යෝජනා කිහිපයක් සංශෝධනයට ලක්කිරීමට අකමැත්තෙන් වුවත් රනිල්ට හා මුදල් ඇමතිට සිදුවී ඇති බව ආණ්ඩුවට සම්බන්ධ අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

ආණ්ඩුව ඇතුලේ ප්‍රතිවිරෝධය සහ බාහිර ප්‍රතිවිරෝධයද එකිනෙකින් පෝෂණය වී පෙරට පැමිණ ඇත. මැතිවරණයේදී ලබාදුන් විවිධ පොරොන්දු කඩකිරීම පිළිබඳව කලකිරීමට පත් මෙම ආණ්ඩුව බලයට ගෙනඒමට කටයුතු කල සිවිල් සංවිධාන, විශ්ව විද්‍යාල ආචාර්යවරු හා ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු බලවේග වල දැඩි විවේචනයටද ආණ්ඩුව පාත්‍රවී ඇත. මහින්ද රජය පරාජය කර ජ.වි.පෙ. යේ දායකත්වය මත ගොඩනැගූ මේ දක්ෂිණාංශික ආණ්ඩුව ගන්නා ජනතා ද්‍රෝහී පියවරයන් පිළිබඳ ජ.වි.පෙ ට ඇති වගකීමෙන් ඔවුන්ට නිදහස් විය නොහැකි බව එම පක්ෂයේම අනුගාමිකයින් පවසන බව එම පක්ෂයට සම්බන්ධ ආරංචි මාර්ග පවසයි.

මේ අතර බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පරාජය කරනුලැබ හෙළ උරුමයේ නිශාන්ත වර්ණසිංහ ඇමතිවරයා ඉවත් කිරීම මඟින් රනිල් හා ආණ්ඩුවේ ශ්‍රී.ල.නි.ප. පාර්ශවය අතර ඇති සීතල යුද්ධය එළිපිටට පැමිණ ඇති අතර මෙම ප්‍රතිවිරෝධය චම්පික රණවක ඇමතිවරයා ආණ්ඩුවෙන් එළියට වැටීම දක්වා දුරදිග යාමට ඉඩ ඇතැයිද සැලය.

මැතිවරණයට පෙර ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැපවන බවට ප්‍රතිඥා දෙමින් රඟපෑ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීවරියගේ මැර ක්‍රියාව යහපාලනයේ සාරාර්ථය කෙලෙසූ ආසන්නතම සිද්ධිය බව ආණ්ඩුවට හා ශ්‍රී.ල.නි.පක්ෂයට සම්බන්ධ මැති ඇමතිවරුන් බහුතරයකගේ මතය වී තිබේ. මේ නිසා ඇයව අත්අඩංගුවට නොගැනීම පිළිබඳව ආණ්ඩුව ඇතුලේම ආරවුල් හටගැනීම නිසා ඇයව නාමිකව පොලීසිය මඟින් අධිකරණයට පමුනුවා ඇප ලබා දී ඇත.

මේ අනුව ඊනියා යහපාලන ආණ්ඩුවේ අධිරාජ්‍ය ගැති ජනතා විරෝධී ප්‍රයෝගකාරී ප්‍රතිපත්ති වලට විරුද්ධව සෑම ක්ෂේත්‍රයකින්ම නැගී එන ජනතා විරෝධය හමුවේ කෙටිකාලයකින්ම මෙම රජය අනාගෙන ඇති බවත්, මෙම රජයට විරුද්ධව ඡන්දයදුන් සන්ධානයේ ලක්ෂ සංඛ්‍යාත ජනතාව අතරමං නොකරමින්, ආණ්ඩුවට විරුද්ධව ඔවුන් පෙළ ගැස්වීමට පක්ෂ භේදයකින් තොරව සියළුම බලවේගයන් එක්සත් වියයුතු යයි ඒකාබද්ධ විපක්ෂයේ නායකයෝ ප්‍රකාශ කරති.

මේ අතර පොදු ජනතාවගේ ජීවන මට්ටම කප්පාදු කරන මෙම ආණ්ඩුවට විරුද්ධව සියලු වෘත්තීය සමිති වල දායකත්වයෙන් ජාතික කම්කරු සමුලුවක් කැඳවීමට ක්‍රියාකරගෙන යන බව ස්වාධීන වෘත්තීය සමිති මධ්‍යස්ථානයක ප්‍රකාශකයෙක් ශක්තියට පැවසීය.

ඉදිරියේදී ආණ්ඩුව නව ව්‍යවස්ථාවක යෝජනාව ඉදිරියට දමමින්, ආණ්ඩුවට විරුද්ධව එන ජනතා විරෝධය ජාතිවාදී සිංහ ලේ පැත්තට හරවා මර්ධනකාරී පියවරකින් අධිරාජ්‍යගැති සැලසුම ක්‍රියාවට නැගීමේ ක්‍රමවේදයක් පිළිබඳව ආණ්ඩුවට සම්බන්ධ ඉහළම කීපදෙනා අතර සාකච්ඡාවක් පැවතී ඇති බවද සැලය.■

1 වන පිටුවෙන් **මහා කම්කරු...**

වෘත්තීය සංගම් විසින් බවද සැලය. පසුගිය රජය පරාජය කිරීමට හේතුවූ ජනතා ව්‍යාපාරයේ පංගුකරුවන් වූ විද්වතුන්ගේ සංගම්ද කැඳවුම් කරුවන් අතර සිටින බව සැලය. මෙම සමුළුව කැඳවනු ලබන්නේ මෙතෙක් කාලයක් රජයේ සේවකයන්ට රජයෙන්ම ලැබුනු විශ්‍රාමය අවලංගු කර රාජ්‍ය සේවකයන්ගෙන්ද ඒ සඳහා මසකට මුදලක් කපා ගැනීමේ යෝජනාවටද, අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල මහ බැංකුවේ භාරකාරීත්වයෙන් ඉවත් කිරීමේ යෝජනාවටද, ජනතාවට සේවාවන් සපයන රාජ්‍ය සංස්ථා සහ රජයට ලාභ ගෙනදෙන රාජ්‍ය ව්‍යවසායන් විකිණීමේ යෝජනාවටද, පොහොර සහනය වෙළෙඳ පොලට දැමීමෙන් ඇතිවන අසීරුතාවයන්ටද, මිල මුදල් ඇති හැටියට නිළ ඇඳුම් රෙදි ගැනීම නිසා පාසල් නිළ ඇඳුමේ බැලූබැල්මට පංතිභේදය දැක්වීමටද, ඉහළ පංතියට බදු සහනදීම සඳහා විවිධ බදු යෝජනා මඟින් පොදු ජනතාවගේ කරමතට විශාල බරක් දැමීමටද, එරෙහිව ගතයුතු පියවර පිළිබඳ සාකච්ඡා කිරීමට බවද සමිති නියෝජිතයන්ගෙන් දැනගැනීමට ඇත.■



# කවලං ආණ්ඩුවේ ජනතා දේපොල කොල්ලය සඳහා
# අවලං පාලනයක්..!

**ලෝ**කය පුරා ගෝලීය උණුසුම ඉහලයාම නිසා ජෛව ගෝලයේ පැවැත්ම පිලිබඳව විද්වතුන් අතර සාකච්ඡා මාලාවක් පැවැත්වෙමින් තිබේ. ජාත්‍යන්තර නව සම්මුතියක් සඳහා පැරිසියට එක්වූ 2500ක් වූ ලෝක නියෝජිත පිරිස කෝප් 21 සමුළුවෙහි යෝජනා සම්මත කළත් එය ක්‍රියාත්මක කිරීම නව ලිබරල් ආර්ථික ක්‍රියාවලිය නිසා සිතළුවක් පමණකි. බීජිං නගරයේ වායු දූෂණය නිසා සිදුවිය හැකි මානව බේදවාචකය වලක්වා ගැනීමට කැනඩාවෙන් පිරිසිඳු වායුව ආනයනයට සැරසේ. ජීවිත දසදහස් ගණනක් හා විශාල දේපොලක් වනසමින් මීට වසර 11කට පෙර ලංකාවේ සිදු වූ සුනාමි විපත සිහි කෙරෙන මොහොතේදීම ඇප්ගනිස්ථානය, පකිස්ථානය හා ඉන්දියාව යන රටවල් තුනටම බලපාන ලෙස ප්‍රබල භූ කම්පනයන් තුනක් එකවිට සිදුවීම සොබාදහම වියරුවීමේ අනතුර ලොවටම දක්වා තිබේ. තවදුරටත් නව ලිබරල් ගෝලීයකරන ආර්ථික පිලිවෙත ඉදිරියට ගෙනයනවාද එසේත් නොමැති නම් ජනතාවගේ පමණක් නොව සතා සිවුපාවා, ගහ කොල ආරක්ෂා වෙන ආර්ථික පිලිවෙතක් අනුගමනය කරනවාද යන්න ගෝලීය දේශපාලනඥයින්ගේ හදවතට තට්ටු කර අසන කාලපරිච්ඡේදයකට අපි සැම අවතීරණ වෙමින් සිටිමු. එය අප දන්නා පංති සටන ඉක්මවා යන්නකි. මෙවර දුරුත්ත සීතලට වඩා වැසිබර ගතියත් දිවා කල දැඩි උනුසුමත් එකට වෙලෙමින් තිබේ. දේශපාලනයේද හැඩරුව කාලගුණයට අනුරූපව සටන් උනුසුමත් උත්සව සමයේ සෞදර්යත් සමග ඔකට වෙලෙමින් ඇත. දුරුත්ත බොහෝ විට සටන් සඳහා සාකච්ඡා අරඹන ඉල්ලීම් පෙරට ගෙනෙන කාලයයි. ඒනිසා තැන තැන පවතින විරෝධතා ඒකරාශී වෙමින් තීරණාත්මක ආකාරයේ පෙලගැස්මක් හදන්නේ කෙසේද යන සාකච්ඡා මාලාවක් වැඩබිම, ගොවිබිම, ජනතා බිම සිසාරා උනුසුම් සුලං රැල්ලක් ලෙස පැතිරෙනු ඇත. එමගින් පක්ෂ පුපුරයි. බලවේග දෙදරයි. සන්ධාන ඉරිතලයි. නව මාවතක ඉදිරියක් පෙන්වීම දුරුත්තෙන් මුලපුරනු ඇත.

## හෙල උරුමය පුපුරයි

**යූ**.ඇන්.ජී. නායකයින් වූ තිලක් කරුණාරත්න, එච්.එල්.ගුණසේකර වැනි අය යූ.ඇන්.පී.ය ගරා වැටෙන විට සිංහල ජාතිවාදය වපුරමින් සිහල උරුමය ගොඩනැගූවේය. එය පසුකාලීනව ජාතික හෙල උරුමය වී ලොකු කස්තිරමක් අල්ලා නැවතත් යූ.ඇන්.පී.යේ ගොමපස් අල්ලන අත්ගෙඩියක් වූ ආකාරය ගැන දේශපාලනය නොදත් බොහෝ දෙනා දෑස් ලොකු කර ගෙන විමතියෙන් බලා සිටී කාලය අවසන් වෙමින් තිබේ. දැන් ඔවුන් ඊලඟ අඩව්වට සූදානම් වේ. විශේෂයෙන් චම්පික හා රතන හිමි යන දෙපොල දෙකොනක සිටින අතර පලමුව බස්නාහිර පළාත් අමාත්‍ය වර්ණසිංහ මහතාගේ වර්ණ ගැලවීම ඉසුරු මහඇමති අතින් සිදුවූ ආකාරය දැකගත හැකි විය. දැන් වර්ණසිංහ පළාත් සභාවේ ස්වාධීනව කටයුතු කරන බව කියා සිටී. මේ අනුව දැන් චම්පිකටද සිදුවී ඇත්තේ යූ.ඇන්.පී.යේ වැඩපිලිවෙලට මුළුමනින්ම අවනතව සිටිමය. රතන හිමි පරිසරය රැකගැනීමේ සටන මුලට ගෙන සිරිසේන ජනාධිපතිගේ ඇඟේ එල්ලෙන ආකාරයක් පෙනෙන්නට තිබේ. හෙල උරුමයට මෙසේ වුයේ ජාතිවාදය මුල්වූ රාජ්‍ය තත්ත්වය පත්වන්නේ පැසිස්ට්වාදයකටය. ඉන් මෙපිට නවාතැන් පොලක් නොමැති බව තේරුම් ගන්නා බොහෝ පිරිස් වෙන්වී ඇත්වීම ක්‍රම ක්‍රමයෙන් සිදුවෙමින් තිබේ.



## දෙමල සන්ධානය දෙදරයි

**උ**තුරු නැගෙනහිර දමිල දේශපාලනයේ නොසැලුන මතවාදී දහරාව වූ දමිළ ජාතික සන්ධාන දෙදරුම්කෑමකට ලක්වෙමින් තිබේ. එයට හේතුව වී ඇත්තේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල පවතින තත්වයට වඩා මුළු රටම දේශපාලන වශයෙන් නව උනුසුමක ගමන් කිරීමය. දෙමළ සන්ධානයේ සම්බන්ධන් මහතාගේ නායකත්වයෙන් යුත් පිරිස විපක්ෂ නායක ධුරය භාර ගෙන සිරිසේන - රනිල් ආණ්ඩුවේ පාර්ශවකරුවෙකුවීම කරනකොට ගෙන දමිළ ජනතාවගේ අභිලාශයන් මුදුන් පත් කර ගැනීමට ඔවුන්ගේ ක්‍රියාකලාපය බාධාවක් බවට එම සන්ධානය අභ්‍යන්තරයේ මත ගැටුමක් වර්ධනය වෙමින් තිබේ. මහඇමති විග්නේශ්වරන් මහතා ඇතුළු පිරිස දෙමළ ජාතික සභාව නැමති සංවිධානයක් ද කැඳවා තිබේ. එයට ඊපීආර්එල්එෆ් නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්, පාර්ලිමේන්තු මන්ත්‍රී ගජේන්ද්‍රන්, ජ්ලොට් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී සිද්ධාර්ථන් ඇතුලු ආගමික හා බුද්ධිමතුන් පිරිසක්ද එක්වී තිබේ. මෙම පිරිස රජයේ සේවයේ අත්දැකීම් ඇති නීතිය ගැන දැන උගත් උතුරටත් වඩා දකුණ සමඟ ශක්තිමත් සම්බන්ධකම් පවතින කණ්ඩයමක් වන බැවින් කොටුවූ ඊලමක රැඳී සිටිනවාට වඩා ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැගීමේ අඩිතාලම පිලිබඳ විවාදයේ පාර්ශවයක් ලෙස සැලකීම උචිතය. රජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම නොව යුතු නමුත් දෙමළ ජනතාවගේ දැවෙන ප්‍රශ්ණ විසඳා ගැනීම අමතක කළ නොහැකි බව මොවුන්ගේ අදහස බව පෙනේ. එහෙත් රජය පැත්තෙන්ද විග්නේෂ්වරන් මහතාට අන්තවාදී කෝනයෙන් දැඩි ප්‍රහාර එල්ල කරමින් තිබේ.

විශේෂයෙන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කරන මොහොතේදී බලය බෙදීම හා සම අයිතිය ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම ප්‍රමුඛත්වයට පැමිණෙමින් තිබේ. ඩයස් පෝරාවේ අන්තවාදී කණ්ඩායම් සම්බන්ධන්ට විරුද්ධ වන අතර, මධ්‍යස්ථ කණ්ඩායම් බොහොමයක් විග්නේෂවරන් මහතාට පක්ෂව සිටින බව පෙනේ. ප්‍රාදේශීය සභා ඡන්ද පැවැත්වෙන විට වෙනම තරඟ කිරීම දක්වා මෙම බලවේග වර්ධනය විය හැකිය. සම්ප්‍රදායික දමිළ සන්ධාන දේශපාලනය උතුරේ පවතින ජනමතය සමඟ එකට සිටිමින් ඔවුන්ගේ මතවාද රැක ගැනීම චෙල්වනායගම් මැතිතුමාගේ අවධියේ සිට මේදක්වා සිදුවූ ඓතිහාසික සිදුවීම්ය. අධිරාජ්‍යවාදීන් හා ඩයස් පෝරාවේ හයියෙන් ඒකීය නොවන රාජ්‍යයක් තුල ස්වපාලනයක්ලබාගත හැකියයි ඔවුහු සිතති. ඒ සඳහා සිරිසේන වික්‍රමසිංහ පාලනයේ අනුග්‍රහයද අවශ්‍ය බව ඔවුහු සිතති. උග්‍රමතවාදීන් සිතන්නේ අධිරාජ්‍යවාදී ඩයස්පෝරා උදව්වෙන් පෙඩරල් තත්ත්වයට එහා යාමට උත්සහ කළ යුතු බවය. මෙය සැබවින්ම දෙමළ ජාතික ව්‍යාපාරයේ එදා සිට පැවති ප්‍රභේදයයි.

## නිදහස් සන්ධානය ඉරිතලයි

**සි**රිසේන මහතා නිදහස් සන්ධානයේ නායකයා ලෙස ප්‍රචලිතවීමත් සමඟ සන්ධානයේ ඒකාබද්ධ ශක්තිය ලිහෙමින් ඇත. විශේෂයෙන් එම තත්ත්වය සන්ධානයේ පමණක් නොව ශ්‍රී ල.නි.ප.ය තුලටද බලපාමින් තිබේ. ශ්‍රී ල.නි.ප. මෛත්‍රී කණ්ඩායම යූ.ඇන්.පී. න්‍යායපත්‍රයක් අනුව කටයුතු කිරීම ඉවසුම් නොදෙන සන්ධාන බලවේගය ඒකාබද්ධ විපක්ෂය ලෙස කටයුතු කිරීම පාර්ලිමේන්තුව තුල ආරම්භ කලේය. ඒකාබද්ධ විපක්ෂය පාර්ලිමේන්තුවෙන් පිටත ජනතලයටද සීඝ්‍රයෙන් ගමන් කරමින් තිබේ. එය නිදහස් සන්ධාන ''නිල'' කණ්ඩායමට බිය ජනක කරුණකි. පළාත් පාලන ඡන්දයෙන් අත්විය හැකි පරාජය නිසා ඡන්දය කල් දැමීමට පියවර ගෙන තිබේ. නගර සභා විසුරුවා නොහැර කාලය දිර්ඝ කරනු ලැබුවේ එනිසාය. බැසිල් අමාත්‍යවරයා පළාත් පාලන සීමා නීර්ණය තුවාලයක් බවට පත් කර ගත් ආකාරයෙන්ම රනිල් අගමැතිද දැනට සිදු කරමින් ඇත්තේ යූ.ඇන්.පි.උවමනාව අනුව කොට්ඨාශ වෙන් කිරීමට සංවිධායකයින් ලවා යෝජනා ඉදිරිපත් කරවීමය. මෙයට නිලධාරින්ගේද සහය ලබා ගෙන පැරණි ක්‍රමයට ඡන්දය පැවැත්වීම පිලිබඳ බලපෑම සිදු කරමින් තිබේ. සිරිසේන ජනපති පෙන්වන්නේ පලාත් පාලන ඡන්දය කල්දමමින් හෝ මනාප ක්‍රමය අවසන් කර කොට්ඨාශ ඡන්ද ක්‍රමය ගෙනඑන බවය. නමුත් සිදුවෙමින් ඇත්තේ නිදහස් සන්ධානයත්, ශ්‍රී ල.නි.ප.යත් ජනතාවාදී උවමනාවට පිටුපා යූ.ඇන්.පි.ය පිටුපස ගමන් කිරීමට විරුද්ධව නැග එන ජනතා කෝපය ඒකාබද්ධ විපක්ෂය සමඟ එක්වෙමින් තිබීමය. එනිසා නැවතත් මහින්දට මුවාවී නිල බලය අල්ලා ගැනීමට සිරිසේන ජනපති සමඟ සිටින සූත්‍රකරුවන් පිඹුරුපත් සකසමින් සිටී.

## අයවැය බහුරුකෝලමක්

**මෙ**වර අයවැය මෙතෙක් පැවති සියලු සම්ප්‍රදායන් බිඳ දමමින් පිස්සාගේ පලාමල්ලක තත්ත්වයට පත් කර ගැනීමට මුදල් ඇමතිට සිදුවිය. මුදල් අමාත්‍යවරයා අනුන්ගේ අදහස් තමන්ගේ බවට ඉදිරිපත් කරන්නට ගොස් මහත් අපහසුතාවයකට පත්න සිටී. රාජ්‍ය පාලනය මුළුමනින්ම අවුල් කොට, රටත් ජනතාවත්, මූල්‍ය පද්ධතියත් විනාශයකට ගෙන යන ආකාරයේ අයවැය යෝජනා බොහෝමයක් ඉදිරිපත් වී තිබේ. ඒකාබද්ධ විපක්ෂයත්, වැඩකරන ජනතාවගේ අභියෝගත් හමුවේ යෝජනා ක්‍රියාත්මක නොකරන බවට අගමැතිවරයා ප්‍රකාශයක් කලත් එම යෝජනා ඉවත් කිරීම මෙතෙක් සිදු නොවීය. ආණ්ඩු හිතවාදී වෘත්තීය සමිති කණ්ඩායම් වර්ජනය මඟහැර ගියත්, බැංකු සේවකයෝ එකාවන්ව නැගීසිටීම නිසා ශ්‍රී ල.නි.ප. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ගේද ඉහමොල රත්වන්නට විය. ඔවුන්ද යෝජනා රැසක් ජනාධිපතිවරයා සමඟ එක්ව සාකච්ඡා කර වෙනස් කල බව ප්‍රකාශ විය. මේ නිසා අයවැය පලාමල්ලක තත්ත්වයට පත්වී අවසානයේ ඉදිරිපත් කළ සියලු ඇස්තමේන්තු වෙනස් වී ඇති බැවින් සංශෝධිත යෝජනාවක් ජනවාරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. දැනටමත් වෛද්‍යවරුන් තම ඉල්ලීම් ගැන ජනවාරි 04ට දින ලබාදී වර්ජනයකට සූදානම් වේ. බැංකු සේවකයින් වර්ජන තීන්දු ගෙන ඇති අතර සමස්ත රාජ්‍ය සේවයම නොසංසුන්වී සිටී. අයවැයෙන් මතුවූ වටපිටාව අනුව යහ පාලනයක් නොව අවම ආණ්ඩු පාලනයක් නෙමැති අරාජික තත්ත්වයකට රට පත්වෙමින් තිබේ.

## අවලංපාලනය විනාශයක්

**ක**ලවං ආණ්ඩුවේ පිලිවෙත ගැන බහුතර ජනතාව කළකිරීමට පත්වී තිබේ. අයවැය යෝජනා වලින් පසුව කලවං ආණ්ඩුව බලයට ගෙනඒමට මුල්වූ මැද පංතික බුද්ධිමත්හු වික්ෂිප්තව සිටිති. ඔවුන් අතර තියුනු බෙදීමක ලක්ෂණ පෙනෙනනට තිබේ. අයවැය යෝජනා නිසා බලාපොරොත්තු කඩවූ මැදපංතිය වඩාත් කලකිරී සිටින අතර පහල මැද පංතිය දැඩි අර්බුදයකට ගමන් කර තිබේ. ආර්ථිකය වෙළඳපොලට හැරවීම සඳහා රනිල් ඇතුලු යූ.ඇන්.පී. නඩය ක්‍රියාත්මක වන අතර වැඩකරන ජනතාව හා පොදු ජනතාවගෙන් බුර බුරා පැන නගින විරෝධතාවයන්ට දක්වන ප්‍රතිචාරයක් ලෙස ජනපති මෛත්‍රී ඇතුලු ශ්‍රී ල.නි.ප. ඇමති කට්ටුව ජනතා සුභසාධනය බාල කර පවත්වා ගැනීම සඳහා විවිධ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරමින් තිබේ. දෙබිඩි ආණ්ඩුව දෙබිඩි පිලිවතකින් කටයුතු කරන බව ජනතාවට පෙනෙන්නට පටන් ගෙන ඇත. ආණ්ඩුව පවත්වා ගෙන යාම වත්තම් කර ගැනීම සඳහා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය කැඳවන බව පෙනේ. මෙම සංකීර්ණ දේශපාලන තත්ත්වය වෙනස් විය හැක්කේ ඒකාබද්ධ විපක්ෂය ජනතා විරෝධයේ සාධකය දක්වා වර්ධනය වීම තුලය. එයට ටික කලක් ගතවේ. එතෙක් මෛත්‍රී-රනිල් බාල් නැටුමද, රාජපක්ෂ විරෝධය ජනතා මතකයේ රඳවා තබාගැනීමට කටමෑත දොඩවන රාජිත - චම්පික රූපවාහිනී නාලිකාවල හඬනැගීම ආණ්ඩු විරෝධී ජනතාවට දරා ගැනීමට සිදුවනු ඇත.■

**සිරිසුමන විදානපතිරණ**

2016-01-02

# රට පුරා ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පෙළ ගැසේ..



අයවැය යෝජනා මගින් රජයේ සේවක විශ්‍රාමය අහිමි කිරීමත්, පුද්ගලික අංශයේ සේවක හිමිකමක් වූ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල කොටස් වෙළඳපොලේ අනාරක්ෂිත අයෝජන වල යෙදවීමත්, ගොවිජනතාවගේ පොහොර සහනාධාරය ඇතුළු සහන කප්පාදු කිරීමත්, රජයේ දෙපල, ඉඩම්, දේශීය විදේශීය කොම්පැනි කරුවන්ට විකිනීමට විරුද්ධවත්, ඒකාබද්ධ විපක්ෂය විසින් ධාරාණිපාත වර්ෂාව නොතකා පැවැත්වූ දැවැන්ත උද්ඝෝෂණය...



කුඩා තේ කට්ටි හා රබර් කට්ටි කරුවන්ගේ නිශ්පාදන සඳහා සහතික මිලක් නොලැබීම පිළිබඳව රජය මගින් පොරොන්දු වූ මිලගණන් ලබා නොදීම ගැන විරෝධතාවය දැක්වීම..




අය වැය මගින් ගෙන එනු ලැබූ අයිතිවාසිකම් කප්පාදු යෝජනාවන් අනුව රජයේ සේවක විශ්‍රාමය, වාහන බලපත්‍ර අහිමි කිරීම හා පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරෝධතාව දක්වමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුළු දීපව්‍යාප්ත සේවාවලට අයත් නිලධාරීන් සංගම් අටක් එක්වී එක් දින වර්ජනයක් පවත්වා විරෝධතා දැක්වීම..



අය වැය මගින් පොහොර සහනාධාරය ඉවත් කිරීමට විරුද්ධව අම්බලන්තොට නගරයේදී ගොවිජන අයිතීන් සුරැකීමේ ජාතික සංධානයේ හම්බන්තොට ක්‍රියාකාරී කමිටුව මගින් අම්බලන්තොට නගරයේ සංවිධානය කරනු ලැබූ දැවැන්ත ගොවි උද්ඝෝෂණය..




ආණ්ඩුව විසින් පොහොර සහනාධාරය හා වී සහතික මිල කප්පාදු කිරීමට විරුද්ධව ගොවීන් දහස් ගනනක් එක්වී කොලඹ දී විරෝධතා පා ගමනක යෙදෙන විට පොලිස් බාධක සමඟ ගැටෙමින්...




හැටන් නැෂනල් බැංකුවේ සේවක මර්ධනයට විරුද්ධව ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ලංකා බැංකු සේවක සංගමය විසින් මෙහෙයවනු ලැබූ කෑම පැය විරෝධතාව..



කුණු ගොඩ ගසා නිදහසේ ජීවත්වීමේ අයිතිය පැහැර ගැනීම වෙනුවෙන් සත්‍යග්‍රහයේ නිරත වූ මීතොටමුල්ලේ ජනතාවට ආණ්ඩුව එල්ල කල මැර ප්‍රහාරය හෙලා දකිමින් රජ රට විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කල විරෝධතා උද්ඝෝෂණයක් රජ රට විශ්වවිද්‍යාලය ඉදිරිපිට දී පැවැත්විණි..




"ඉතිහාසය පුරාවට පුද්ගලික වෛද්‍ය විද්‍යාල ලෙස පැමිණි අනතුරු ප්‍රගතිශීලී මිනිසුන්ගේ මැදිහත්වීමෙන් හකුලාගන්නට එයට හවුල් වූ දේශපාලන බලය හා මුදල් බලය හිමි පාර්ශවයන්ට සිදුවිය. එනිසා ජනතාවට විශ්වාසනීය වෛද්‍යවරුන් බිහිකරන රජයේ වෛද්‍ය විද්‍යාල පද්ධතිය තවමත් ආරක්ෂා වී පවතී. නැවතත් පුද්ගලික වෛද්‍යවිද්‍යාල අනතුර SAITM යන වෙළඳ නාමය යටතේ නැවත ක්‍රියාත්මක වෙමින් පවතී. 'අප ආ මග තවත් පරපුරක් වෙනුවෙන් සුරක්ෂිත කරමු' ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය විසින් මෙහෙයවන උද්ඝෝෂණ පත්‍රිකාවක් ඇසුරෙනි..



අයවැය යෝජනා මගින් රජයේ සේවක විශ්‍රාමය අහිමි කිරීමත්, පුද්ගලික අංශයේ සේවක හිමිකමක් වූ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල කොටස් වෙළඳපොලේ අනාරක්ෂිත අයෝජන වල යෙදවීමත්, ගොවිජනතාවගේ පොහොර සහනාධාරය ඇතුළු සහන කප්පාදු කිරීමත්, රජයේ දෙපල, ඉඩම්, දේශීය විදේශීය කොම්පැනි කරුවන්ට විකිනීමට විරුද්ධවත්, ඒකාබද්ධ විපක්ෂය විසින් ධාරාණිපාත වර්ෂාව නොතකා පැවැත්වූ දැවැන්ත උද්ඝෝෂණය...



අය වැය මගින් බැංකු සේවක අර්ථසාධකය හා අයිතිවාසිකම් වලට එල්ල වූ තර්ජනයත් බැංකුවට අදාල සේවාවන් පුද්ගලික මූල්‍ය සමාගම් වෙත පැවරීමට විරුද්ධව සංකේත වර්ජනයක් පවත්වා කොටුව දුම්රියපොල ස්ථානයේ පැවති දැවැන්ත උද්ඝෝෂණය..

## කුරුවිට කලාපයේ ජනතාවාදීන් දුමින්ද කුමාර සහෝදරයා කැඳවයි.

කුරුවිට කලාපයේ ජනතාවාදී ක්‍රියාකාරින් ප්‍රාදේශීය සභා අපේක්ෂක දුමින්ද කුමාර සහෝදරයා විසින් ජනවාරි 24 වෙනිදා උදේ 10.00 කැඳවා ඇති බව ශක්තිය ප්‍රාදේශීය වාර්තාකරු දන්වා තිබේ. මෙම රැස්වීමට පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර පළාත් සභා මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය ප්‍රදේශීය සභා මන්ත්‍රීවරුන් වන අනිල් ලියනගේ, රත්නසිරි ඇතුලු පිරිසක් සහභාගීවීමට නියමිතය. ■

## දිරිය මාතාවකගේ අභාවය සිහිපත් කරමු..

බණ්ඩාරගම ප්‍රදේශයේ සමසමාජ ව්‍යාපාරයේ ප්‍රබල නායකයෙකු වූ අභාවප්‍රාප්ත ගම්සභා නියෝජිත එස්.එස්.රණසිංහ සහෝදරයාගේ ආදරනීය බිරිඳ වූ නැලිස්නෝනා රණසිංහ මාතාව පසුගිය දිනක අප අතරින් සදහටම වෙන් විය.

ඇය විසින් මෙලොවට බිහිකළ දූ දරුවන් බොහෝ දෙනා වාමාංශික ව්‍යාපාරයේ කැපකරුවන් විය. උපාලි රණසිංහ සහෝදරයා නව සමාජ පක්ෂයේ ආරම්භක අවදියේ සිට කැපවී කටයුතු කළ අතර, ලංකා ශිෂ්‍ය සම්මේලනයේ කැළණිය විශ්ව විද්‍යාලයේ නායකයා ලෙසද, කැළණි විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ නායකයෙකු ලෙසද කටයුතු කලේය. මොහු ආකර්ශනීය ප්‍රබල කථිකයෙක් ලෙස එදා ශිෂ්‍ය ව්‍යාපාරයේ ජනාදරයට පත්විය. උපාධිය අවසන් කර කළක් පුද්ගලික අංශයේ කළමනාකරුවෙක් ලෙස සිටිමින් දේශපාලනයේ නිරත වූ උපාලි සහෝදරයා රැකියාව සඳහා විදේශගත විය. මේ වන විට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ කැනඩා ශාඛාවේ නායකයා ලෙසද ඔහු කටයුතු කරයි.

කොළඹ වරායේ කාර්මික අංශයේ සේවය කළ සුමිත් රණසිංහ සහෝදරයා සටන්කාමී වෘත්තීය සමිති ක්‍රියාකාරියෙක් වූ අතර නව සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරී පාක්ෂිකයෙක් විය. ජේ.ආර්. යුගයේ න.ස.ස.ප ඇතුලු වාමාංශික පක්ෂ තහනම් කල අවදියේ අවධියේ වරායේ සේවකයින් පක්ෂ තහනමට විරුද්ධව සංවිධානය කිරීම නිසා පාලකයින් විසින් ඔහුගේ රැකියාව අහිමි කලේය. එතැන් පටන් පූර්ණකාලිකයෙක් ලෙස දුෂ්කර හා අවදානම් කාර්යයන් ඉටු කිරීමට ඉදිරිපත් වෙමින් පක්ෂය සමඟ ඉතා සමීපව කටයුතු කලේය. ජේ.ආර්.ගේ මැයි දින තහනම නොතකා පක්ෂ නායකයින් සමඟ පෙරමුණ ගත් සුමිත් රණසිංහ සහෝදරයා එදින පොලිසිය සමඟ ඇති වූ ගැටුමකින් ප්‍රහාරයට ලක්ව සටන්කාමීන් කීප දෙනෙකු සමඟ ඔහුවද අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කළේය. සුමිත් සහෝදරයා පක්ෂයේ තරුණ සටන්කාමීන් මෙහෙයවූ ප්‍රබල වීරයෙක් විය. පසු කලෙක ඔහු රෝගීව සිට අකාලයේ අප අතරින් සදහටම වෙන් විය.

පියාගේද උපාලි හා සුමිත් යන වැඩිමල් සොයුරන්ගේද අභාෂයෙන් නව සම සමාජ පක්ෂයට ශිෂ්‍ය අවදියේම ඇතුලත් වූ සරත් රණසිංහ සහෝදරයා ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ ආරම්භක සාමාජිකයින් කිහිප දෙනා අතර සිටි අයෙකි. ඔහු බණ්ඩාරගම ආසනයේ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ සංවිධායක මෙන්ම පක්ෂයේ උප ලේකම්වරයාද ලෙස සිය වගකීම් ඉටු කරන්නේය. පක්ෂ නායක වාසුදේව නානායක්කාර සහෝදරයා අමාත්‍ය ධූරය දැරීමට පෙර සිට පුද්ගලික ලේකම් ලෙස ඔහු වෙත විශ්වාසයෙන් වගකීම් භාර දුන් අතර, අමාත්‍ය ධූරය දැරූ කාල පරිච්ඡේදයේදීද මන්ත්‍රීවරයා ලෙස කටයුතු කටයුතු කරන වර්තමානයේදීද එම තනතුරේ වගකීම සරත් සහෝදරයා දරමින් සිටී. පූර්ණකාලීනව තම හැකියාවන් වාමාංශික හා ජනතාවාදී දේශපාලනයට කැප කරමින් බණ්ඩාරගම ආසනයේ ලලිත් එල්ලාවල පළාත් සභා මන්ත්‍රීතුමා සමඟ සමීපව සිටිමින් ඒකාබද්ධ විපක්ෂය ශක්තිමත් කිරීම සඳහා වැදගත් මෙහෙවරක් ඉටු කරමින් සිටී.

සමසමාජ ව්‍යාපාරය විසින් උරුමකර දුන් වාමාංශික ව්‍යාපාරයේ සටන්කාමී ජීවගුණය ඉදිරියට ගෙනයාමට කැප වූ පවුලක බර දරා සිටි නැලිස්නොනා මාතාවගේ වියෝව එම පවුලේ නෑසිය හිතවතුන් සැමටත්, අප පක්ෂයටත්, ප්‍රදේශයේ ප්‍රගතිශීලී ජනතාවටත් දැරිය නොහැකි පාඩුවක් ලෙස සඳහන් කරමු. ■


පී.වී.ඩී.තිලකසිරි
**නියෝජ්‍ය ලේකම් ප්‍ර.වා.පෙ.**

## පරපෝෂිතයන්ට ගොදුරු වී විරූපී නොවන්න

මිනිසාට වැළදෙන රෝග අතරින් විරූපීතාවයට ලක්වන්නකි බරවා රෝගය. මෙය මදුරුවෙකු මඟින් බෝවන හෙයින් මේ සඳහා පරපෝෂිත වර්ගයන් දෙකක් ඇත. එනම් Wucherian Bancroft සහ Brugiamalayi වේ. මෙයින් වැඩි වශයෙන් වාර්තා වන්නේ Wuchererian Bancroft ය. මෙම මදුරුවන් රුධිරය උරාබොන්නේ රාත්‍රී කාලයේදීය. Culexquinquefasciatus ගැහැණු මදුරුවා බිත්තර දමන්නේ අපිරිසිදු ජලයේය. මෙය ශරීරයේ වසා පද්ධතිය තුල පරපෝෂිතයෙකු ලෙස ජීවත්වන Nematode වර්ගයේ කුඩා පණුවෙකු විසින් ඇති කරනු ලැබේ. ලෝකයේ නිවර්තන කලාපවලට අයත් රටවල් 81 ක පමණ පවතින අතර මිලියන 120 ක් ආසාදනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. තවද මිලියන 1100 කට වැඩි ජනතාවකට මෙය තර්ජනයක් වී තිබේ. දකුණු ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාව, මාලදිවයින, ඉන්දියාව, බංගලාදේශය, මියන්මාරය, නේපාලය, ඉන්දුනීසියාව, තායිලන්තය, යන රටවල මෙම රෝගය පවතී. බරවා රෝගය වැළදීමෙන් මිය යන්නේ නැති නමුත් දිගු කාලීනව විරූපිතාවයන්ට ගොදුරුවේ. එම නිසා සමාජයීය, ආර්ථික සහ මානසික අපහසුතාවයන්ට හේතුවක්ද වේ.

වර්ෂ 1947 දී ශ්‍රී ලංකාවේ බරවා මර්දන ව්‍යාපාරය ආරම්භ කර ඇත. බරවා රෝගය වැළදී කාලයක් ගතවූ පසු රෝග ලක්ෂණ මතු කරයි. පිටතින් නිරෝගී බව පෙනුනත් ශරීරයේ බරවා පරපෝෂිත පණුවන් සිටිය හැකිය. එවිට ඔබගෙන් රෝගය පැතිරීමේ අවධානයක් ඇත. වසරකට බරක් රුධිරය පරීක්ෂා කරගැනීමට කටයුතු කරන්න. මෙය සෞඛ්‍ය අමාත්‍යාංශයේ බරවා මර්දන ඒකකයේ දැනුවත් කිරීමකි. ■

**එච්. ඩී. මහේෂ් මල්රාජ්**



## පාර්ලිමේන්තු සභා ගැබෙන්

2015.12.10 වන දින කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අවස්ථාවේදී වාසුදේව සහෝදරයා කල කථාවේ සාරාංශය.

කම්කරුවන් කියන්නේ තමන්ගේ හැකියාව, තමන්ගේ ශ්‍රමය, තමන්ගේ දැනුම විකුණා ඒ වැටුපෙන් ජීවත් වන අයයි. ඒ අය මේ සමාජයේ ප්‍රභූවරුන් නොවෙයි. ඒ අය මේ සමාජයේ එක එක තලවල සිටින අයයි. නමුත් ඒ අය අන් කෙනෙකුගේ සේවකයන් හැටියට තමයි වැඩ කරන්නේ. අන් කෙනෙකු ප්‍රධාන වූ ආයතනයක සේවක මට්ටමේ වැඩ කරන ශ්‍රමය විකුණන මේ ජනයා සාමාන්‍යයෙන් සමාජ ගණුදෙනු වලදී දුබල පැත්තටයි වැටෙන්නේ කියන තේරුම උඩ ඉදගෙනයි කම්කරු නීති හදලා තිබෙන්නේ. ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්ති හදලා තිබෙන්නේ, මේ සේවකයාට රැකවරණය ලබාදීම පිණිසයි. සේවකයාගේ දුබලතාව ස්වභාවයෙන්ම තිබෙන නිසයි. ඒ කෙසේ වෙතත්, ඒ සේවකයා නොසිටින්න මේ ලෝකයේ මොකුත් නැහැ කියන එකත් කියන්න ඕනෑ. ඉංජිනේරු මහත්වරුන් ඉන්න පුළුවන්. එතුමන්ලා අවශ්‍යයි. ඒ වාගේම තාක්ෂණික දැනුම තිබෙන අය ඉන්න පුළුවන්. ඒ අයත් අවශ්‍යයි. නමුත් මේ අය ඔක්කෝම සිටියත්, අන්තිමට ඒවා ක්‍රියාවට නැගෙන කම්කරුවාගේ දෑතින්ම තමයි සියලූම දේ නිර්මාණය වෙන්නේ. කම්කරු දිනයක් ලෝකයේ තිබෙන්නේත් ඒ නිසායි. කම්කරුවා විවිධ මට්ටම්වලින් හඳුන්වනවා. සුදු කර පටි කම්කරුවා, නිල් කරපටි කම්කරුවා වශයෙන්. නමුත් ඊටත් ඉහළ තාක්ෂණයේ යෙදෙන අය කම්කරු නාමයෙන් හැඳින්වුයේ නැතත්, ඒ අයත් මේ කියන වර්ගයට ඇතුළත් වෙනවා.

### කම්කරු අයිතිවාසිකම් රකිනු !

කම්කරුවාට එම රැකවරණය කොපමණ හොඳින් ලබාදෙනවාද නැද්ද? අපේ කම්කරු නීති තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුවක් තිබෙනවා. කම්කරු උසාවි තිබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, මේ සේවකයාට එරෙහිව නිතරම නැගී සිටින අනෙක් පාර්ශවය වන හාම්පුතා සමාජයේ බලවත් කෙනෙකු වීමයි. ඒ නිසා ඔහුගේ බලපෑම සමාජයේ හැමතැනකම තිබෙනවා. කම්කරුවාගේ අයිතිවාසිකම් උඩ කම්කරු නීතිය ක්‍රියාත්මක වෙන්න යනකොට. අර හාම්පුතාගේ බලපෑම් නිසා ප්‍රමාදයන්, බාධාවන් ඇති වෙනවා. මේ විවෘත ආර්ථිකයේ ව්‍යසනයත් සමග පසුගිය කාලය මුළුල්ලේම කම්කරුවාගේ යුක්තිය පිළිබඳව කටයුතු කරන නිලධාරී තන්ත්‍රයේ ස්වභාවයත් එන්න එන්නම ක්‍රමානුකූලව කම්කරුවාට අහිතකර වී තිබෙනවා.

### රු. 2500 /= නීතිගත කරනු !

ඊළඟට පෞද්ගලික අංශයට රුපියල් 2500/= ක් දෙන එක. මේකට කෙකර ගගා ඉන්නේ මොකටද? රුපියල් 2500/= පොරොන්දුව දී දැන් අවුරුද්දකට ළංවේගෙන එනවා. නීතිය ගෙනාවේ නැත්තේ හාම්පුතාලාට උදවු කරන්න ඕනෑ නිසායි. ඒකයි ඇත්ත කථාව. ඒකයි මගේ චෝදනාව.

### Manpower අහෝසි කරනු!

Manpower කියන වසංගතය මේ රටට හඳුන්වා දුන්නේ 1977න් පසුව ඇති කල විවෘත ආර්ථිකයේ ව්‍යසනයත් එක්කයි. මේ Manpower සේවකයන් කියන්නේ එක්තරා වහලූන් පිරිසක්. මේ මිනිසුන්ට කිසිම අයිතිවාසිකමක් නැහැ. ඔවුන්ගේ රැකියාවේ සුරක්ෂිතභාවයක් නැහැ. තමුන්නාන්සේලා මේ පිළිබඳව ක්‍රියාත්මක වෙයිද කියා මට නම් සැකයක් තිබෙනවා.

### පැය 8 වැඩ දිනය සහතික කරනු!

ඊළඟට දින පහේ සතිය ගැන කථා කරනවා. ඒක, දවසේ වැඩ කරන පැය 8, පැය 9 දක්වා වැඩි කිරීමේ උපක්‍රමයක්. ඒකට කම්කරුවන් සම්පූර්ණයෙන්ම විරුද්ධයි ඒ කරුණු කම්කරුවන්ටයි, හාම්පුතුන්ටයි කථා කර ගන්න ඉතුරු කරන්න.

### විශ්‍රාම වැටුපට අත නොතබනු!

ඊළඟට රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුපට තමුන්නාන්සේලා කැපිල්ල දාලා තිබෙනවා. රජයේ සේවකයෝ තමුන්නාන්සේලාගේ යෝජනාව පිළිගන්නේ නැහැ. රුපියල් 10,000/= ක් ලැබුණු නිසා රජයේ සේවකයෝ තමයි බලාපොරොත්තු තියාගෙන තමුන්නාන්සේලාට හොඳට ඡන්දය දුන්නේ. දැන් ඒ ගොල්ලන්ට ඒකේ කොඩිවිනය කණපිට හැරිලා එනවා. ඒ වුණත් අපි ඒ අය වෙනුවෙන් කථා කරන්න ඕනෑ.

### ඉහල ආදායම් ලබන අයට බදු වැඩි කරනු!

අනෙක් පැත්තෙන් ආණ්ඩුව සියයට 24ට, 28ට තිබුණු බද්ද සියයට 16 දක්වා අඩු කරලා ආණ්ඩුවේ ආදායම අඩු කරගෙන තිබෙනවා. අඩු අදායම්ලාභින් බර අදිනවා, ඉහල ආදායම් තිබෙන උදවියගේ පහසුව හා සහනය වෙනුවෙන්.

### වතු කම්කරු වැටුප් වැඩි කරනු!

අපි වතු කම්කරුවන් ගැනත් කියන්න ඕනෑ. වතු කම්කරුවන්ට රුපියල් 1000ක් දෙන්න පොරොන්දු වුණා. තමුන්නාන්සේලා පොරොන්දු වුණු ඒවා තමයි මේ. මේ වතු කම්කරුවන්ට දෙන පර්චස් 7ක ප්‍රමාණය අපට වහාම දෙන්න පුළුවන්, මේ පර්චස් 7ක් ලබා දීමේ වැඩපිළිවෙළ ප්‍රමාද නොකර ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

### පොරොන්දු වූ සහතික මිල ලබා දෙනු!

දින සියයේ පොරොන්දු ගැන කථා කරන කොට, තේවලට සහනාධාර දෙන පොරොන්දුව කඩ කිරීමේදී, රබර් සහනාධාර පොරොන්දුව කඩ කිරීමේදී, වීවලට වැඩිකරපු මිල නැවත අඩු කිරීමේදී තමුන්නාන්සේලා කඩවුණු පොරොන්දුවේ නායකයින් බවට පත්වෙලා තිබෙනවා.

### නිදහස් වෙළෙඳ කලාපයේ කළමනාකරණය පෞද්ගලික අංශයට නොදෙනු!

නිදහස් වෙළඳ කලාපයේ කළමනාකරණය පෞද්ගලික අංශයට දුන්නොත්, නරියාට කුකුළන් භාර දුන්නා හා සමානයි. මේක මහා භයානක යෝජනාවක්.මේක නිදහස් වෙළෙඳ කලාපයේ කම්කරුවන්ගේ අයිතිවාසිකම්වලට විරුද්ධව අටවන මර උගුලක් බව අපි කියන්නට ඕනෑ.අගමැතිතුමා අපට කියනවා තිත්ත බේත් බොන්න කියලා. මේ අය වැයේ තිත්ත බේත් තිබෙනවාලූ. මහජනයා තිත්ත බෙහෙත් පොවයි ආණ්ඩුවට.මට බාධා කරපු දුෂ්ටයාට මගේ විරෝධය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

# හෝ ගානා පොකුණ විශිෂ්ඨයි..



ඩබ්.කේ.ඒ.ඩබ්. ප්‍රනාන්දු

ළමා ලොව පියකරුය, විසිතුරුය. ඔවුන් සැරි සරනා සිහින ලොව සමනල වර්ණ, දේදුණු වර්ණයෙන් යුක්තවේ. අහිංසක බවින් පිරිපුන්ය. ඒ වර්ණවත් ලොවෙහි අහිංසක පැතුම් සුන්නත්දූවිලි කරන්නේ වැඩිහිටි පරපුරය. එසේ වන්නේ ඔවුන් (වැඩිහිටි පරපුර) තම ළමාවියේ පසක් කල දෑ සිතින් අමතක කිරීම නිසාම නොවේ. එයට හේතුව ඔවුන් තැලෙන මිරිකෙන වැරදි අර්ථක්‍රමය නිසාය. වෙසෙසින් හද්ද පිටිසර දරුවන්ගේ පැතුම් සමුදාය අපේ විද්‍යුත් මාධ්‍ය වලින් තිරය මෙන්ම පුංචි තිරය මගින් මතුවුනේ ව්‍යාජලෙසය. නියම ගම ගැමියන්ගේ දුක්ඛිත දෝමනස්යන්, නියමාකාරයෙන් විවරණය කිරීම වෙනුවට ව්‍යාජ ගමක් ගහ කොළ ඇසුරෙන් නිර්මාණය කරයි.

'හෝගාන පොකුණ' ළමා චිත්‍රයක් වශයෙන් හදුන්වනවාට වඩා එය ළමයින් පෙලෙනා ප්‍රශ්න මැනවින් විවරණය වන බව කිව යුතු වේ. ඉන්දික ෆර්ඩිනෑන්ඩු මෙම චිත්‍ර පටය තුළින් තල දෙකක කථාවක් තිරය මත දිගහරියි. මෙහි මුල, මැද, අග හුයකින් බැඳ තබන අපදානයක් නොවේ. ගම, ගැමියන්, ආබයනයේදී ළමයින්, ඔවුන් සූරාකන බලවේග (ග්‍රාමසේවක චරිත) මගින් ගම්‍ය වේ. මෙහි එන ළමයින් ගැන කියවන කථාවට අමතරව ඔවුන් මෙන්ම ඔවුන්ගේ පවුල් තත්වය යටි පෙලින් විවරණයවේ. ඉන්දික ෆර්ඩිනෑන්ඩු මෙහි තිරනාටකය තල දෙකකින් මැනවින් විවරණය කරයි. උදේ කෑම නොකෑ දරුවකු කලන්තය වී වැටීම, සිය පියා මිනීමැරුමකට හිර බත් රස බලන අයුරු කීම, එම දරුවන්ගේ ලසෝ වේදනා මැනවින් ගම්‍ය වේ.

දොඹේගමුව ප්‍රාථමිකයේ මුල් ගුරුවරයා (ලොකු ඉස්කෝලේ මහත්තයා) ලූසන් බුලත්සිංහල සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවේ වහලෙක් විය. එමගින් ඉගැන්වීම් ක්‍රමය තුළ ළමයින්ගේ යටපත් වු හිරවු හැකියාවන් මතුකරන එම ප්‍රාථමිකයට පැමිණි ගුරුවරිය (අනුසුයා සුබසිංහ) සිසුන් අතර ඇති කරගන්නා සංනිවේදනය මගින් ඔවුන්ගේ දුක්ඛ දෝමනස්සයන් හඳුනා ගන්නීය.

මෙහි දී එම ගුරුවරිය ලොකු ඉස්කෝලෙ මහත්තයාගේ සාම්ප්‍රදායික ප්‍රවනතා වෙනසකට බදුන් කරන්නේ ගැටුම්කාරී තත්ත්වයකට නොගොස් එම සිසු සිසුවියන්ගේ සිහින ලොව ජය ගැනීමට මං සෙවීම මෙම චිත්‍රපටියේ මුලික තේමාව වේ. එම ළමා ක්‍රියාකාරකම්වලට අනුසාංගිකවන ගුරුවරියගේ භූමිකාව තුළ (අනුසුයා සුබසිංහ) මැනවින් පීවත් වන්නීය.

සාම්ප්‍රදායික මුල් ගුරුවරයාගේ චරිතය සංකීර්ණ වේ. එම චරිතය වරෙක කෝපයෙන් ද වරෙක කරුණාව මුසුවූවෙකු ලෙස ලූසන් බුලත්සිංහල ගැමි කම මෙන්ම වෘත්තීය පැසුනු බව පළ කරන රංගනය විශිෂ්ඨය. මගේ හැගීම අනුව ඔහු රඟපෑ විශිෂ්ඨම චරිතය මෙය වේ.

ජයලත් මනෝරත්න බේබඳු රියදුරු චරිතය තුළ මැනවින් පීවත් වේ. ජයනි සේනානායක, දයාදේව එදිරිසිංහ පැසසිය යුතුවේ. මෙහි රඟන සියල්ල සිය රඟපෑම් මැනවින් ඉටුකොට ඇත.

චන්න දේශප්‍රිය කැමරාවෙන් සිය කාර්ය මැනවින් ඉටුකොට ඇත. ගැමි රටාවට අනුන ආකෘතියකට සරිලන රූපරාමු අගය කළ යුතුවේ. ළමයින් පිරිවරා ගුරුවරියගේ පියානෝ වාදනය කරන ජවනිකාව හා බසයේ ජවනිකාව අගය කළ යුතුවේ.

දිනේෂ් සුබසිංහගේ සංගීතය හෝ ගාන පොකුණ වර්ණවත් කරයි. සමහර ගීත, පසුබිම්ව ඇසෙන දෑ සිය සංගීතයට මුසු කොට ඇත.  එමඟින් උත්ප්‍රාසයකට ගෙන ඒමට සංගීතය ඉවහල් වු බව කිව යුතුය.

පසුගිය සමයේ ළමා චිත්‍රපට සේ බිහි වු සිනමා පට ළමා ලොව දෙස එබී බැලුවේ මඳ වශයෙනි. ටයිටස් තොටවත්තගේ හඳයාගෙන් පසුව බිහි වු සාර්ථක ළමා චිත්‍රපටිය 'හෝගාන පොකුණයි'. ටයිටස්ගේ හඳයා නාගරික මුඩුක්කු ළමයින්ගේ අනවතර පෙලීම් විවරණය කරන අතර 'හෝ ගාන පොකුණ' ගැමි දරුවන්ගේ අභිප්‍රායන් මැනවින් විවරණය කෙරේ.

'හෝගාන පොකුණ' සෑම අතින්ම උත්කර්ෂවත් උපරිමයකට ගෙන ආ ළමා චිත්‍රපටයක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතුවේ. අධ්‍යක්ෂ ඉන්දික ෆර්ඩිනැන්ඩු 'හෝ ගාන පොකුණ' අධ්‍යක්ෂකවරයා වශයෙන් සිය මෙහෙවර මැනවින් ඉටුකර ඇත.■

## නමින්ද .. මන්ත්‍රී මාමා ගැන...



| | |
|---|---|
| කවි ගී රසකථා කියවෙන  එකට | එක |
| සිසු දැරියන්ගේ මල් වැනි මුහුණු | දැක |
| ඔබගේ සිතට පොත පත ගැන සිතුනු | එක |
| කොතරම් වටිනවද ඔබ පොත් බෙදන | එක |
| මා පොඩි කාලෙ අම්මල මා දමල | ගියා |
| ඉගනුම ලබන්නේ දුක්කරදර හිතේ | තියා |
| හිත හිත දුක්වුනා පොත් පත් නැතැයි | කියා |
| පොත් දෙන පිනට මතුබුදුවෙයි මාමේ | ඔයා |
| වු වැසි වලට හිද හිද සෙවන ලැබු | වටේ |
| එනතුරු බස් එකක් තෙමි තෙමි සිටින  අප | රටේ |
| ඉදිකර තිබෙන බස් නැවතුම්ද නෙත | ගැටේ |
| පොදුවැඩ කලොත් ඔබ තව තවත් ඔප | වැටේ |
| කවියෙන් ලිව්වේ ශක්තිය පල | කරන්නටයි |
| සියලුම මුදල් වැය කරනුයෙ පොදු | වැඩටයි |
| මේ ආදර්ශෙ මහජන නියෝපිත | ඔබටයි |
| සියලුම වැඩි ලකුණු අපෙ මන්ත්‍රී | නමින්දටයි |

**එච්.ඩී.ටී. සිබිනගෙදර**
හනිෆාවත්ත

## අයවැය උළලේනා හඬයි

| | | |
|---|---|---|
| යොමු | වුණු බමුණු අදිරද අබිවාද | නය |
| දෙමු | හුන්-ආණ්ඩුවෙ අයවැය | ලේකනය |
| අමු | කුණු හරුප-පෙර පාසල් | දේසනය |
| අමු | ඩෙන් නවත් වන්නද ලේ | පාචනය |
| මං | ගල නොවෙයි පෑ අවමංගල | දෝනා |
| නැං | වු හඬක් වෙයි අය-වැය | උළ ලේනා |
| හුම් | හුම් කියන මුන් හැමතැන මහ | මූණා |
| තුන් | සිංහලයෙ ගෙන මිරිකයි මහ | සෝනා |
| දිය | යුතු අද්දියාපනයට දොරි | දෝරේ |
| විය | දම පිණිස ලාහෙන් කහවණු | බාරේ |
| නිය | මයි දුන්නෙ කෙන් ගෙඩියද අවි | චාරේ |
| අය | වැය නොවෙයි ගජබින්නාලං | කාරේ |
| තලු | මර මර වැමැරුම දෙයි-කළ | සාද |
| කලු | ගල් හිතක අසරණයට-මොන | වාද |
| හෙලු | වද තඹයකින් අවුසද මිළ | යෝද |
| සුලු | දිය කූඹියට-උෟ ලඟ මහ | මූද |
| සහ | නය පෝර සහ පාසල් නිළ | ඇඳුම |
| අහ | වර කරන්නයි වෙස් මුහුණක් | බැඳුම |
| දහ | වල් මිගෙල් රූ දනියෙල් බත | යෙදුම |
| මහ | උන්නැහේ නැහැ මේ කටයුතු | පුදුම |

**රණගල සමරසිංහ**

## නරා වලක්වු පොකුණ

හංස පූට්ටුව
නරි පූට්ටුවක් වී
රෙපිමයක් වී
නරි බුරති !
කියති හූ
හංස (නරි) පූට්ටුවේ
ගෙරවිල්ලෙන්
ඝෝෂාවෙන්
ලතෝනියෙන්
තැතිගත්
මතෂ්‍ය  අෑ සත්වයෝ
කැකෑරුණු
මඩ ගොහොරුවක් වූ
පොකුණු දියේ
හුස්ම පොදක්වත්
ගැනීමට
ඉස්පාසුවක් ඉඩක්
නැතිව
තැවෙති
සෝතැවුල් නගති

**මංගල විජේසිංහ**

## අපගේ ශෝකය

අඹගහ, හල්පිටිය, එම්.කේ. විජිතකුමාර (රාල) සහෝදරයා තරුණ වියේදීම වාමාංශික දේශපාලනයට එක්වී කැපවීමෙන් කටයුතු කල අයෙකි. හදිසියේ සිදුවු ඔහුගේ වියෝව ප්‍රදේශයේ ක්‍රියාකාරීන්ට දැරිය නොහැකි ශෝකයකි. ජනතාවට පිහිටවූ උදාර ගම් නායකයෙකුගේ අභිමිවීමකි.■

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හා ප්‍රජාතන්ත්‍රවාදි වාමාංශික පෙරමුණේ ක්‍රියා කාරි තරුණ නායකයෙකු වූ කෝශල හඩ්ෂන් සහෝදරයාගේ සදාදරණීය පියාණන් වු මාෂල් සිල්වා මහතා වියෝවීම පිළිබඳ අපගේ සංවේගය පල කරමු.■

ප්‍රජාතන්ත්‍රවාදි වාමාංශික පෙරමුණේ ක්‍රියාකාරි සාමාජිකයෙකු මෙන්ම රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වාසුදේව නානායක්කාර සහෝදරයාගේ රියදුරු බී.කේ.ඥානරත්න (ශාන්ත) සහෝදරයාගේ මෑණියන් වූද, කලවාන ආසනයේ අයගම සංවිධායක ලක්මාල් සහෝදරයාගේ ආදාරණීය මිත්තණිය වුද, ඇහැලියගොඩ පලීගල විසු ඒ.කේ. ලීලාවතී මාතාවගේ අභාවය පිළිබඳ අපගේ සංවේගය පලකරමු.■

# සුභසාධනවාදී රාජ්‍ය රටාව වලදැමීමට සැරසෙන
# ව්‍යවස්ථා සංශෝධයට විරෝධය..

## 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් ඉදිරියට යාමට සූදානම් විය යුතුයි.

**මැ**තිවරණ පොරොන්දු ඉටු කිරීමේ ජනප්‍රිය කඩතුරාවට මුවා වී අධිරාජ්‍යවාදි නව ලිබරල් ආර්ථික වැඩපිලිවෙල 1978 ඒකාධිපති ව්‍යවස්ථාවෙන් එපිට යන ආකාරයට ජනතාව තලාපෙලා නිර්ධය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ජේ.ආර්. යුගයටත් වඩා මර්ධනකාරි ඒකාධිපති ව්‍යවස්ථාවක් අළුතින් නිර්මානය කර ගැනීමට යූ.ඇන්.පී. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ලහි ලහියේ සූදානම්වන වන බව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුන හා ශ්‍රී ලංකා මහජන පක්‍ෂය ඒකාබද්ධව නිකුත් කල නිවේදනයක සඳහන් වේ.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය බලවත් කිරීම නොව විධායක අගමැති තනතුරක් ඇති කර, පොදු දේපොල සමාගම්වලට විකුණා, අධිරාජ්‍යවාදීන්ගේ මූල්‍ය සේවා තිත්පොලක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමට දක්ෂිනාංශික නායකයන්ට අවශ්‍යව ඇත. විදේශිකයින්ද, තානාපති කාර්යාලවල විදේශිය අරමුදල් වලින් යැපෙන කුමන්ත්‍රණකරුවන්ද මොවුන්ගේ අත්උදව්කරුවන් ලෙස රටටත් ජනතාවටත් විරුද්ධව ගොනුවෙමින් සිටින බව එම නිවේදනයේ දැක්වේ.

රනිල් මහතාගේ තුන්වෙනි පරම්පරාවේ නව ලිබරල් දක්ෂිනාංශික සමාජ ආර්ථික වැඩපිලිවෙල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර එයට අනුකූලව අයවැය සකසා



මුදල් අමාත්‍යවරයා මගින් කියවනු ලැබුණි. එමගින් රජයේ සේවක විශ්‍රාමය කප්පාදු කර, ගොවි සහනාධාරය, සෞඛ්‍ය, අධ්‍යාපන, සමාජ සුභසාධන කපාදමා, රාජ්‍ය බැංකු, රාජ්‍ය රක්ෂණය විනාශ කර, සේවක දේපොලක් වන අර්ථසාධකයසේවක භාරකර අරමුදල, දේශීය විදේශීය ජාවාරම්කරුවන්ගේ පරිහරනයට ඉඩහැර අනාරක්ෂිත කර, ජනතාව මත බදු පිට බදු පනවා, පොදු දේපොල, රාජ්‍ය සම්පත් හා රාජ්‍ය ඉඩකඩම්, වෙළඳපොල ශක්තිමත් කිරීමේ නාමයෙන් විදේශිකයින්ට විකුණා අධිරාජ්‍යවාදීන්ගේ නව කොලනියක් බවට රට පත් කිරීමට යෝජනා කර තිබේ. අයවැය යෝජනාවලට එරෙහිව ඇතමුන්ගේ පාවාදීමද නොතකා බැංකු සේවක වර්ජනය, ගොවි ජන උද්සෝෂණ, වෛද්‍ය හා ශිෂ්‍ය විරෝධතා හමුවේ ආණ්ඩුව තාවකාලිකව යෝජනා පසුපසට ගනු ලැබූ බව පෙන්නුවේය. එම යෝජනා මර්ධනකාරීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නව යාන්ත්‍රණයක් සකසා ගැනීම සඳහා ව්‍යවස්ථාවක් හැදීම මොවුන්ගේ කඩිනම් උවමනාව වී තිබේ.

නව ව්‍යවස්ථාව සැකසිය යුත්තේ 1972 ව්‍යවස්ථාවේ ඉදිරියක් ලෙස මිස 1978 ඒකාධිපති ව්‍යවස්ථාව මෙන් අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවන් අනුව මනදොල සපුරන ආකාරයකින් නොවන අතර, සංශෝධනයන් ඇතිවිය යුත්තේ ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමත්, පාර්ලිමේන්තුවට බලය පැවරෙන කොට්ඨාශ අනුපාත මිශ්‍ර ඡන්දය ක්‍රමයක් ඇති කිරීමත්, පළාත් සභා සහිත ඒකීය රාජ්‍ය ආරක්ෂා වෙන ආකාරයකිනුත්ය.

රටේ භෞමික අඛණ්ඩතාවය, පොදු ජනතාවගේ නිදහස, ප්‍රජාතන්තවාදී අයිතිය, සෞඛ්‍ය, අධ්‍යාපන, ගොවිජන සහනාධාර, අර්ථසාධකසේවක භාරකාර අරමුදල, රාජ්‍ය බැංකුරක්ෂණයඉඩම්, රාජ්‍ය රැකියා ඇතුලු සුභසාධනවාදී රාජ්‍ය රටාව වලදැමීමට සැරසෙන මෙම ජනතා ද්‍රෝහී වැඩපිලිවෙලට විරුද්ධව ගොවි ජනතාව ඇතුළු වැඩකරන ජනතාව එකාවන්ව පෙල ගැසී මහා ජාතික සමුළුවකට ගොනු වන ලෙස සියළු දේශපාලන පක්ෂ නායකයින් හා පොදු ජන සංවිධාන වෙත එම නිවේදනයෙන් ආයාචනය කර ඇත.■

## ජනතාවට බදු පිට බදු පැටවූ 2016 අයවැයෙන් ජීවන මට්ටම පහලට

**යූ.**එන්.පී. මෛත්‍රී ඊනියා යහපාලන හවුල් ආණ්ඩුවේ මංගල අයවැය මඟින් ගෑස් ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ 11 ක මිල පහලට දමා ජනතාවට සහන ලබාදුන් බවට සිදුකරන ප්‍රකාශය යථාර්තයක් නොමැති පුස්සක් බවට, නොබෝ දිනකින්ම ජනතාවට වැටහී යනු ඇත. නව ලිබරල්වාදය විවෘතවම බදා වැළඳගෙන එම ආර්ථික මුලෝපායන් මත පදනම්ව ඉදිරිපත් කර ඇති මෙම අයවැය යෝජනා මඟන්, එක් පසෙකින් පසුගිය මැතිවරණ වලදී ජනතාවට ලබාදුන් පොරොන්දු අමු අමුවේම කඩකර ඇති අතර අනෙක් පසින්, රජයේ සේවකයන් ඇතුලූ පොදු ජනතාව භුක්තිවිදි බොහෝ වරප්‍රසාද හා අයිතිවාසිකම් බරපතල ලෙස කප්පාදු කර ඇති බව පෙනී යයි. මේ අනුව අග්‍රාමාත්‍යවරයා අයවැය විවාදයේදී ප්‍රකාශ කල පරිදිම මෙය ඉහල මධ්‍යම පන්තිය හා ධනපති පංතිය ශක්තිමත් කිරීම සඳහා වූ අයවැයක් බව ප්‍රජාත්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර සහෝදරයා නිකුත් කල නිවේදනයක දැක්වේ.

වතුකරයේ ජනතාවගේ වැටුප වැඩිකරන බවට දුන් පොරොන්දුවද, ගොවිජනතාව වෙනුවෙන් ලබාදුන් පොහොර සහනාධාරය ඇතුළු සහතික මිලද කප්පාදු කර ඇත. පාසැල් නිල ඇඳුම් වෙනුවට මුදල් වව්චර් පත් ක්‍රමය මඟන් එම සහනයද, කපා හැරීමේ පළමු පියවර තබා ඇති අතර, අධ්‍යාපනය සම්බන්ධයෙන් අයවැයෙහි වැය නොකරන සාවද්‍ය ඉලක්කම් දමා ඇත. වාහන බද්ද 75% සිට 100% දක්වා වැඩි කිරීමෙන් සියලූ වාහන වල මිල ඉහල යන අතර පාසැල් වෑන් රථවල මිල ඉහල දැමීමෙන් එම බරද ජනතාව මත පටවා ඇත. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය බරපතල ලෙස බාල්දු වීම නිසා සියලූ අත්‍යාවශ්‍ය භාණ්ඩ වල මිල සේම වාහන අමතර කොටස් වල මිලද සීඝ්‍රයෙන් රමයෙන් ඉහල යෑමට සැලැස්වීමෙන් සුළු වාහන හිමියන් ද අර්බුදයකට ලක්කර ඇත.

එසේම රුපියල බාල්දුවීමෙන් ජනතාව කබලෙන් ලිපට වැටෙනු ඇත. වැට් බදු මෙන්ම ජාතිය ගොඩනැගීම සඳහා වන බදු ප්‍රතිශතයද නැංවීම මඟින් රුපියල් මිලියන 90,000 ක ආදායමක් බලාපොරොත්තු වන ආණ්ඩුව එම බරද ජනතාවටම දැරීමට වන බැව් හොඳින්ම දනී. කුඩා මෝටර් රථයක් මිලට ගැනීමට සිටි මධ්‍යම පාන්තික ජනතාවගේ බලාපොරොත්තු මෙම අය වැය මඟින් බිඳදමා ඇත. ■

# අධිරාජ්‍ය විරෝධී ජනතා බලවේගයෙන් ඒකරාශි කරමු!
# යූ.එන්.පී. නොවන ආණ්ඩුබලයක් පිහිටුවමු!

## වාමාංශික පෙරමුණේ 06 වන නියෝජිත සම්මේලනයට ඒකාබද්ධ විපක්ෂ නායකයන් එක්වේ

**ප්‍ර**ජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නියෝජිත සමුළුව 2015 නොවැම්බර් 21-22 දිනයන්හි ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් කැඳවූ 300 කට ආසන්න තෝරාගත් සක්‍රිය නියෝජිත පිරිකගේ සහභාගීත්වයෙන් පවත්වා තිබේ.

මාළඹේ, තලාහේන, ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන ශාලාවේදී පැවැත්වුනු මෙම සමුළුවේ සමාරම්භක අවස්ථාවේදී පක්ෂයේ ලේකම් සහෝදරයා විසින් සමුළුව කැඳවීමේ ප්‍රකාශය කියවන ලදී. අනතුරුව මුලාසන මණ්ඩලය ඇතුළු වෙනත් මණ්ඩල පත් කිරීමෙන් පසුව, සූරියමල් ව්‍යාවපාරයෙන් ඇරඹී, අධිරාජ්‍යවාදයට, රදළවාදයට, ධන බලයට, ජාතිවාදයට හා කුල පීඩනයට එරෙහිව ජාතික නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණාත්වය හා ජාතික එක්සත් කම වෙනුවෙන් මහා වැඩවර්ජන වලදීද, ගොවි ශිෂ්‍ය සටන් වලදීද, හර්තාලය ඇතුළු ජනතා අරගලවලදීද, දිවි පිදු සියළුම වීරයන්ද, මුළු ජීවිතකාලයම පක්ෂයේ හා වාමාංශික දේශපාලන ක්‍රියාකාරීත්වය වෙනුවෙන් මෙහෙවර කළ සටන් සගයන්ද සිහි කිරීම සිදු විය.
සමුළුව ආරම්භයේදීම නව ලිබරල් ප්‍රතිපත්තිය නිසා ලොවපුරා සිදුවන විනාශය මැයෙන් මහාචාර්ය සුමනසිරි ලියනගේ සහෝදරයා විසින් කල දේශණය සමුළුවේ විශේෂ සිදුවීමක් විය.

අනතුරුව ජාත්‍යන්තර හා ජාතික දේශපාලන වර්ධනයන් පිළිබඳ දේශපාලන යෝජනාව සභාවට ඉදිරිපත් කරමින් දීර්ඝව කරුණු දැක්වූ පක්ෂයේ ලේකම් සහෝදරයා ජනතාවට බලයක්, ජනජීවිතයට සහනයක්, ආදීනවූ ලංකාවක්, ජාතික එක්සත්කමක්, ගැමි ගොවි පුනර්ජීවනයක් ආදී වූ පරමාර්ථයන් වෙනුවෙන් පසුගිය වසර 15 ක පමණ කාලයක් පුරා



**සරත් රණසිංහ**
උප ලේකම්
ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ

අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව පක්ෂය ගෙනගිය දේශපාලන අරගලය සිහිපත් කරන ලදි.
මෛත්‍රීපාල සිරිසේන මහතා නිසි අවස්ථාවකදී සංධානයෙන් කැඩී ඒ.ජා. පක්ෂය ඇතුළු පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා වෙතැයි පෙර දැක්මට අපට කිසිම හැකියාවක් නොතිබුන බවද පවසන ලදී. එහෙත් අප කළ යෝජනා ක්‍රියායාත්මක නොකරමින් දෙවසරකට පෙර ජනාධිපතිවරණය පැවැත්වීමේ අවදානමද සුළු ජන කොටස් දෙකම අපවෙතින් මුළුමනින්ම ඉවත්වී යාමට හේතුවන පරිදි ඔවුන්ට ඇතිකල පීඩනයන් ගැන පියවර නොගැනීමද බව ජනාධිපතිවරණයේ පරාජයක පෙර නිමිති ලෙස අප දුටු බව පවසන ලදී.

ජනතාවාදී ආණ්ඩුපාලනයක් සඳහා වූ විකල්පය ලෙස ඒකාබද්ධ විපක්ෂය ශක්තිමත් කරමින් පෙරට ගැනීමට ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය දේශපාලන යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ බොහෝ නියෝජිතයෝ අවධාරණය කලහ.


මෙම සමුළුවේ තවත් විශේෂයක් වූයේ වාමාංශික හා ඒකාබද්ධ විපක්ෂයේ සියලූම පක්ෂ නායකයන්ට සුභපැතුම් ඉදිරිපත් කිරීමටත්, නිශ්චිත නියෝජිතයන් පිරිසකට නිරීක්ෂකයන් ලෙස සහභාගී වීමටත් ඉඩකඩ සැලසීමය. එහිදී දිනේෂ් ගුණවර්ධන, රංජිත් සොයිසා හා විමල් වීරවංශ ඇතුළු මන්ත්‍රිවරුන්ද, හෙළ උරුමයේ, මහජන පක්ෂයේ, ලංකා සමසමාජ පක්ෂයේ හා කොමියුනිට්ස් පක්ෂයේ නියෝජිතයන්ද සුභපැතුම් එක් කරනු ලැබීය.

එසේම ස්වභාව හා මානව කේන්ද්‍රිය සාර්ක් කලාපීය ජනතා ව්‍යාපාරයේ නායකයන් වන ගනේෂාම් හා ධිදාර් සිංග් යන සහෝදරවරුද සමුළුවට සහභාගීවෙමින් අධිරාජ්‍යජවාදය විසින් ඇතිකරන පාරිසරික විනාශයට එරෙහිව නිසි ප්‍ර මුඛත්වයක් දී කටයුතු කලයුතු බව පැවසීය. දේශපාලන හා සංවිධායක යෝජනා දෙක දින දෙකක දීර්ඝ හා ගැඹුරු සාකච්ඡාවකින් අනතුරුව අතිවිශාල බහුතර ඡන්දයකින් සම්මත වූ අතර එක් සාමාජිකයකු මධ්‍යශස්ථ විය. අනතුරුව 49 දෙනෙකුගෙන් යුත් මධ්‍යම කාරක සභාවක් නිතරඟයෙන් තෝරා පත්කර ගන්නා ලදී. සම්මේලකයෙන් පසුව රැස්වූ මධ්‍යම කාරක සභාව විසින් සිය පළමු කටයුත්ත ලෙස ඉදිරිකාලය සඳහා ලේකම් තනතුර වෙනුවෙන් වාසුදේව නානායක්කාර සහෝදරයාව ඒකමතිකව තෝරාපත් කර ගැනුනි.■

## ඇහැලියගොඩ විචාර සභාවට සුමනසිරි ලියනගේ සහෝදරයාට ඇරයුම්

**දැ**නට වසර දෙකක කාලයක සිට මාස්පතා ඉතා ජනප්‍රිය මට්ටමින් පැවැත්වෙන ඇහැලියගොඩ විචාරක සභාව ප්‍රදේශයේ ප්‍රබුද්ධ දේශපාලන ක්‍රියාකාරීන් එක් රැස්වෙමින් රට ගමන් කරණ ආකාරය ගැන අදහස් හුවමාරු කර ගනු ලබයි. මෙවර **ජනවාරි 31 වෙනි දින ඇහැලියගොඩදී** පැවැත්වෙන විචාරක සභාවේ දේශකයා ලෙස මහාචාර්ය සුමනසිරි ලියනගේ සහෝදරයාට ඇරයුම් කර ඇති බව පළාත් සභා මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය සහෝදරයා විසින් ශක්තියට වාර්තා කරයි.■

# ශක්තිය



# රනිල්ගේ ව්‍යවස්ථා යෝජනා යටවේ..

## ඒකාබද්ධ විපක්ෂ - ශ්‍රී ල.නි.ප. ඇමති සංශෝධන ඉදිරියෙන්..




දිවා රාත්‍රී පැය ගණනාවක් සාකච්ඡා පිට සාකච්ඡා පවත්වා රජය තුල පූර්ණ එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ ව්‍යවස්ථා සම්පාදක ක්‍රමවේදයේ යෝජනාව අවසාන වශයෙන් ඒකාබද්ධ විපක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින්ද, ආණ්ඩුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කණ්ඩායම වෙනුවෙන් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා විසින්ද ඉදිරිපත් කළ සංශෝධනයන්ට යටත්ව ජනවාරි 12 වෙනි දින පාර්ලිමේන්තු විවාදය ආරම්භ විය. මේ අනුව අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ එක් දිනකින් ව්‍යවස්ථා ක්‍රමවේදය පාර්ලිමේන්තුවේ සම්මත කර, ස්ථාවර නියෝග අත්හිටුවා, ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස පාර්ලිමේන්තුවෙන් පිටත රැස්වී, පිටස්තර පුද්ගලයින්ගෙන් සමන්විත වූ කමිටු පිහිටුවා නව ව්‍යවස්ථාවක් සකසා, බහුතර බලයකින් සම්මත කර පාර්ලිමේන්තු මුද්‍රාව තබා, ශ්‍රේෂ්ඨාධිකරණය මඟහැර කඩිනම් හොර ජනමත විචාරණයකට යෑමේ කූඨ සැලසුම හා යෝජනාව සම්පූර්ණයෙන්ම නිශේධ වී යන තරමට සංශෝධන බලවත් වනු ඇතැයි විපක්ෂයේ මන්ත්‍රීවරියක් ශක්තියට පැවසීය.

2016 ජනවාරි 12 වෙනි දින උදෑසන පාර්ලිමේන්තුව ආරම්භවීමට පෙර පුස්තකාල ශාලාවේදී ශ්‍රී ල.නි.ප. ආණ්ඩුවේ ඇමතිවරු හා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු තමන් විසින් ගෙනඒමට සූදානම් වන සංශෝධන සසඳා බලා වැඩිදුරටත් එකඟත්වයන් තහවුරු කරගත් බවත්, එහි බලපෑම මත පාර්ලිමේන්තු විවාදය දින කීපයක් ඔස්සේ ගමන් කරන බවත්, එනිසා මෙතෙක් කලක් ඒකාබද්ධ විපක්ෂ මන්ත්‍රීවරුන්ට නිසිලෙස කාලය ලබාදීමක් නොකල ද මෙම විවාදයේදී සැලකිය යුතු කාලවේලාවක් ලබාගැනීමට හැකිවූ බවද අපගේ පාර්ලිමේන්තු වාර්තාකරු ශක්තියට දැනුම් දෙන ලදි.

මේ දිනවල ආණ්ඩුව තමන් මුහුණ දී ඇති සුවිශාල අර්බුද සියල්ල වසාගන්නට සීතාම්බර පට සළුවක් ලෙස භාවිතා කරන්නේ ව්‍යවස්ථා වෙනසයි. කොට්ඨාශ මැතිවරණ ක්‍රමය නැවත ඇති වන බවත්, මනාප ක්‍රමය අහෝසි වන බවත්, ජනාධිපති බලය අවසන් කරන බවත්, ජාතික සංහිඳියාවක් ඇති කරන බවත්, එමගින් රටේ ප්‍රජාතන්ත්‍රවාදී වටපිටාව යළිත් ස්ථාපිත කරන බවත්, අගමැතිවරයා ඇතුළු ආණ්ඩුවේ නඩය ගිරව් මෙන් එකදිගට කියාගෙන යති. එහෙත් 19 වෙනි ව්‍යවස්ථා සංශෝධනයේදී ලබාදුන් අධිකරණ තීරණය අනුව ජනමත විමසුමකින් තොරව ජනාධිපති බලය අවසන් නොකිරීමටත්, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට ගෙන එනු ලැබූ 20 වෙනි සංශෝධනය කඩාකල්පල් කිරීමටත් ක්‍රියාකලේ රනිල් ඇතුලු එක්සත් ජාතික පක්ෂයම නොවේදැයි වෙලිංටන් නැමති ජනමාධ්‍යවේදියා යූ.ඇන්.පී.නායකයෙකු ගෙන් ප්‍රශ්ණ කළ විට ඔහුට කටඋත්තර නැතිවී ගිය බව වාර්තාවේ. එක්සත් ජාතික පක්ෂයත් ඔවුන්ගේ හයිබ්‍රිඩ් ආන්ඩුවත් දැන් සූදානම් වන්නේ නියමිත දිනවකවානු අනුව තැබිය යුතු පළාත් පාලන ඡන්දය ව්‍යවස්ථා වෙනසකසට මුවාවී හොර ජනමත විචාරණයක් ලෙස පැවැත්වීමටය.

ප්‍රජාතන්ත්‍රවාදයේ නිම් වළලු පුළුල් කිරීමට කථාකරන එක්සත් ජාතික පක්ෂය මැතිවරණ ක්‍රම වෙනස පිලිබඳව තාමත් නිසියාකාර ප්‍රතිපත්තියක් ප්‍රකාශ කර නැත. ඔවුන් බලාපොරොත්තු වන්නේ දිස්ත්‍රික් මනාප ක්‍රමය රැක ගැනීමටය. පළාත් පාලන ඡන්ද ක්‍රමය වෙනස් කර කොට්ඨාශ හා අනුපාත මිශ්‍ර ඡන්ද ක්‍රමය සම්මත වී හමාරය. කාන්තාවන්ට වැඩි නියෝජන අවස්ථාවක් ලබාදීම, ප්‍රභූවාදී දේශපාලනය පසුබැස්වීම, මැතිවරණ වියදම් අවම කිරීම, මුදලට හා පක්ෂ දේශපාලනයට වඩා ප්‍රදේශ ජනහිතකාමිත්වයට මුල් තැන දීම, තමන් දන්නා හඳුනන මන්ත්‍රීවරයෙක් තෝරාගත හැකිවීම ආදී ජනතාවාදී කරුනු රැසක් එයින් ඉටුවනු ඇත. එහෙත් නව ඡන්ද ක්‍රමය තවදුරටත් පමාවෙමින් තිබෙන්නේ එ.ජා.ප. විසින් තමන්ට වාසිදායක ලෙස කොට්ඨාශ නැවත වෙන් කිරීම සඳහා නව යෝජනා රැසක් සීමානීර්ණ කමිටුවට ඉදිරිපත් කර කල්පමා කරමින් සිටින නිසාය. රනිල් මහතා හීන බලමින් සිටින්නේ හැකිනම් දැනට සම්මත වී ඇති පළාත් පාලන ඡන්ද ක්‍රමයද නව ව්‍යවස්ථා සංශෝධනයෙන් ආපසු හැරවීමටය.

උපක්‍රමශීලී ආකාරයට රනිල් - මෛත්‍රී ආණ්ඩුව පළාත් පාලන මැතිවරණය කල් දමමින් වාසි සහගත අවස්ථාවක් එළඹෙනතෙක් කල්මරන ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව පෙනේ. මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පාර්ශවය මුළුමනින්ම පාහේ සෝදා පාලුවට ලක්වී ඇති නිසා පරාජිත අපේක්ෂකයන් තොග ගණනින් ජාතික ලයිස්තුවෙන් පාර්ලිමේන්තු ගතකලද මෛත්‍රීපාල සිරිසේන මහතාද කල්පනා කරමින් සිටින්නේ ජනතාව අතරට යෑම සඳහා ජනප්‍රිය මාර්ගයකි. රනිල්



යෝජනා කරන ආකාරයට ව්‍යවස්ථාව පෙරට දමා පළාත් පාලන මැතිවරණය කල් දැමීම දැනට මුහුණ දිය හැකි උපක්‍රමය බව උපදේශකයින්ගේ ද අදහස බවය. ඒ සඳහා මෛත්‍රීපාල පිලේ දේශපාලන සගයන් වූ එක්සත් ජාතික පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද, මුස්ලිම් කොන්ග්‍රසයද, දෙමළ සන්ධානයද කොට්ඨාශ ඡන්ද ක්‍රමයට ප්‍රබල විරෝධයක් දැක්වීම, රනිල් විසින්ද පලාත් පාලන ඡන්දය කල් දැමීමට උපයෝගී කර ගෙන තිබේ.

ජනතා විරෝධතා නොතකා පළාත් සභා සහිත ඒකීය රාජ්‍ය රටාව බිඳ දැමීමට හෝ ජනවාර්ගික හා ආගමික ගැටුම් උත්සන්න වන ආකාරයෙන් ලාංකේය රාජ්‍ය ව්‍යුහය වෙනස් කිරීමකට හෝ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යටපත් වන ආකාරයෙන් දැනට යෝජිත කොට්ඨාශ අනුපාත මිශ්‍ර මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට හෝ මෛත්‍රී - රනිල් දක්ෂිණාංශිකයන් සූදානම් වුවහොත් ජනමත විචාරණයෙන් ආණ්ඩුව පරාජය කල හැකි ලෙස ඒකරාශී විය යුතු බව ඒකාබද්ධ විපක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ වන විටත් ප්‍රකාශ කර තිබේ.■

## හිටපු ජනපති මහින්ද

### ඇහැලියගොඩ ආසන සංචාරයක






හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇහැලියගොඩ ආසනයේ ආගමික උත්සව කීපයකට ජනවාරි 17 වෙනිදා සහභාගී වන බව ඇහැලියගොඩ ජනතා භවන සම්බන්ධීකාරක සෝමරත්න සහෝදරයා ශක්තියට වාර්තා කරයි.

පද්බේරිය උපාලි ස්වාමීන්වහන්සේට අක්ත පත්‍ර ප්‍රධානය කිරීමේ ප්‍රධාන උත්සවය පද්බේරිය විහාරයේදී සූදානම් කර තිබේ. එම උත්සවයෙන් අනතුරුව හිටපු ජනපතිට සෙත් පැතිම සඳහා ඇහැලියගොඩ ජනතාව විසින් සූදානම් කර ඇති ආශිර්වාද පූජාවට මහින්ද රාජපක්ෂ හිටපු ජනපති තුමා පස්වරු 4.00ට බුළුගහපිටිය සිරිසුමන පිරිවනේ ආගමික උත්සවයට සහභාගීවීමට නියමිත බව පළාත් සභා මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය සහෝදරයා දැනුම්දී තිබේ. මෙම උත්සව මාලාවට පර්ලිමෙනතු මන්ත්‍රී පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය, පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා ඇතුලු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා ප්‍රභූවරුන්ද එක්වීමට නියමිතය.■

## රක්වාන ඒකාබද්ධ විපක්ෂ ආසන බළමන්ඩලය රංජිත් සොයිසා මන්ත්‍රී නායකත්වයෙන් පිහිටුවයි.



පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් සොයිසා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රක්වාන ඒකාබද්ධ විපක්ෂ ආසන බලමන්ඩලය ජනවාරි 30 වෙනිදා මුළුදෙන බව රක්වාන කරුණාරත්න සහෝදරයා ශක්තියට වාර්තා කරයි.

මෙම රැස්වීමට ඒකාබද්ධ විපක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන ඇතුලුව, වාසුදේව නානායක්කාර, වක්කුඹුර ඇතුලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද නමින්ද අනුරප්‍රිය සහෝදරයා ඇතුලු පළාත් සභා මන්ත්‍රීවරුන්ද හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ද එක්වීමට නියමිත අතර රක්වාන ආසන බලමණ්ඩලය පිහිටුවා ඉදිරි පළාත් පාලන මැතිවරණයට සූදානම්වීමද මෙහි අරමුණක් බව වාර්තාවේ.■

## බලංගොඩ විපක්ෂ ක්‍රියාකාරීන් අබිලගේ නායකත්වයෙන් පෙලගැසේ.



ඒකාබද්ධ විපක්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ආසන මට්ටමේ පලමු සමුළුව පෙබරවාරි 06 වෙනි දින බලංගොඩදී පළාත් සභා මන්ත්‍රී අබිල එල්ලාවල මැතිතුමාගේ නායකත්වයෙන් පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කෙරෙන බව ශක්තියට බලංගොඩින් වාර්තා වේ.

මෙම සමළුවට ඡන්ද කොට්ඨාශ මට්ටමේ නියෝජිතයින් එක්වෙන අතර ඉදිරි පළාත් සභා මැතිවරණය පිලිබඳවද ප්‍රදේශයට බලපාන තීරණ රැසක් ගැනීමට නියමිතය. ඒකාබද්ධ විපක්ෂ නායක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රී තුමා ඇතුලුව, වාසුදේව නානායක්කාර, රංජිත් සොයිසා, ජානක වක්කුඹුර යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද ඒකාබද්ධ විපක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරුන්ද සහභාගීවීමට නියමිතය.■

කොළඹ 10, මරදාන පාර, අංක 47, ස්ටාර් පබ්ලිකේෂන් පුද්ගලික සමාගමේ මුද්‍රණය කර ප්‍රකාශ කරන ලදී.